# වාර්ෂික වාර්තාව

## 2017/18

KALUBOWITIYANA TEA

**කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම**

**වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය**

## දැක්ම

හොඳම ශ්‍රී ලාංකික සීටීසී හා සම්ප්‍රදායික තේ නිපදවීමේ හා අලෙවි කිරීමේ වඩාත්ම පිළිගත් ආදර්ශය බවට පත්වීම.

## මෙහෙවර

දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කරගනිමින් ඉහළ ගුණාත්මකබවින් යුත් රසවත් හා පාරිභෝගික හිතකාමී ශ්‍රී ලාංකික තේ නිෂ්පාදනය කිරීම.

# පටුන


| | |
|---|---|
| කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව සංස්ථාමය තොරතුරු | 3 |
| අපගේ ගමන් මග | 4 |
| විශේෂ සිදුවීම් | 6-7 |
| විශේෂ මූල්‍ය සිදුවීම් | 6 |
| මූල්‍ය නොවන විශේෂ සිදුවීම් | 7 |
| සභාපතිගේ සමාලෝචනය | 8-9 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 10 |
| සංවිධාන ව්‍යුහය | 12-13 |
| කළමනාකරණ සාකච්ඡාප්ව හා විශ්ලේෂණය | 14-33 |
| වෙහෙයුම් තොරතුරු | 16 |
| කර්මාන්තශාලා අනුව ලාභ/(අලාභ) | 18 |
| මාසිත තේ නිෂ්පාදනය | 19 |
| වාර්ෂික තේ නිෂ්පාදනය | 20 |
| මාසික දළු ලබාගැනීම් | 21 |
| වාර්ෂික දළු ලබාගැනීම් | 22 |
| සංසන්දනාත්මක විස්තර - නිෂ්පාදනය | 24 |
| උන්නතාංශය සමග විකුණුම් සාමාන්‍ය සංසන්දනය | 26 |
| ඉහළම මිල ගණන් - 2017/18 | 28 |
| ජයග්‍රහණ - 2017/18 | 29 |
| **මූල්‍ය ප්‍රාග්ධනය** | 30 |
| **මානව ප්‍රාග්ධනය** | 31 |
| **සමාජ ප්‍රාග්ධනය** | 32 |
| **අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව** | 33 |
| මූල්‍ය වාර්තා | 34-66 |
| විගණක වාර්තාව | 36 |
| ලාභ/අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය | 38 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | 39 |
| ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය | 40 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 41 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති | 42 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 47 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන | 60 |
| පූර්ව වසර දහය තළ විශේෂ මූල්‍ය සිදුවීම් | 66 |
| **ආයතනික තොරතුරු** | ඇතුළත පසු කවරය |

# ආයතනික පැතිකඩ
# කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සහ 2007 අංක 07 දරන නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද සීමිත බැඳීම් සමාගමකි. සමාගම ස්ථාපිත කරනු ලැබුයේ සීටීසී තේ නිපදවීම සඳහා වන අතර කොටසක් රු. 10 ක් ලෙස කොටසක් රු. 10 බැගින් තක්සේරු කරන ලද කොටස් මිලියන පහක් ලෙස රුපියල් මිලියන 50 කින් සමන්විත ආරම්භක ප්‍රාග්ධනයකින් එය 1994 අගෝස්තු 1 වන දින වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලදී. ඉන්දීය ණය ආධාර යටතේ ආරම්භක ප්‍රාග්ධනය සපයන ලදී. ඒ අන්දමින්ම ඉන්දීය ණය ආධාර යටතේ අපගේ දෙවන කර්මාන්තශාලාව වූ දෑරංගල තේ කර්මාන්තශාලාව ද ස්ථාපිත කරන ලද අතර 2000 මාර්තු මාසයේදී මෙහෙයුම් ආරම්භ කරන ලදී. කලින් තේ ශක්ති අරමුදල යටතේ පැවැති අපගේ තෙවන කර්මාන්තශාලාව වූ හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව ලාභ බෙදාහදා ගැනීමේ ගිවිසුමක් යටතේ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමට පවරන ලදී. තමන්ගේම අරමුදල් යොදා ගනිමින් සමාගම මෙම කර්මාන්තශාලාව නැවැත ස්ථාපිත කරනු ලැබූ අතර හිනිදුම තේ කර්මාන්තශාලාව 2012 වසරේ සිට මෙහෙයුම් ආරම්භ කරන ලදී.

සමාගමට අළුතින්ම එකතු වූ මැණික්දිවෙල කර්මාන්තශාලාව කලින් තේ ශක්ති පදනමට හිමිව තිබූ අතර එය මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ඡන්ද කොට්ඨාශයේ මැණික්දිවෙල ගම්මානයේ පිහිටා ඇත. මෙම කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීම සඳහා සමාගම තමන්ගේම අරමුදල් භාවිතා කරන ලදී.

කුඩා තේ වතු හිමියන්ගෙන් මිලදී ගත් තෝරාගත් අමු දළු යොදා ගනිමින් සමාගම ආසන්න වශයෙන් ඉතා උසස් තත්වයේ තේ කිලෝග්‍රෑම් 2,000,000 ක් වාර්ෂිකව නිපදවයි.

සමාගමේ තේ නිපැයුම තැරැව්කරුවන් හරහා කොළඹ තේ වෙන්දේසිය වෙත යොමු කරන අතර සුළු ප්‍රමාණයක් ප්‍රධාන කාර්යාලයේ සහ කර්මාන්තශාලාවල ඇති අලෙවි මධ්‍යස්ථාන හරහා දේශීය වෙළඳපොළ තුල අලෙවි කරනු ලැබේ.

සාංගමික ව්‍යවස්ථාවලිය ප්‍රකාරව සමාගමේ විධිනියෝගය පහත දැක්වෙන පරිදි වේ.

- වගාකරුවන්ගෙන් මිලදී ගත් තේ දළු පිරියම් කිරීම, පිරිසැකසුම් කිරීම සහ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරය සිදු කිරීම.
- තේ සිටුවීම, වගා කිරීම සහ තේ වතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම.

## වෙළඳ නාම සහ තේ වර්ග

පහසුවෙන් භාවිතයට ගත හැකි කුඩා පැකට්ටුවල ඇසුරූ තේ මගින් කාර්ය බහුල ලෝකයට සැබෑ තේ රස ලබා දිමට උපකාර වන පීඑෆ් 1 කළුබෝවිටියාන සමාගමේ සීටීසී තේවල උසස්ම ශ්‍රේණිය වන අතර සමාගම සීටීසී නිෂ්පාදනයේ දිවයිනේ ප්‍රමුඛයා වේ. සැලකිය යුතු වටිනාකමක් සහිත අනෙක් ශ්‍රේණිය වනුයේ බීපී 1වන අතර එය දේශීය වශයෙන් අලෙවි කරන අතර මෙරට පාරිභෝගිකයන් අතර ජනප්‍රිය වෙමින් පවතී.

දෑරංගල සහ හිනිදුම තේ තද පැහැය නිසා ප්‍රකටව ඇති අතර පැසීමට සැලස්වූ විටදී කදිම රත් පැහැයකට පත් වන අතර එහි සුවිශේෂී රසය අනෙකුත් කලාප හයෙහිම රසයට වඩා වෙනස් වේ.

මැණික්දිවෙල ලකුණ යටතේ සම්ප්‍රදායික පහත රට තේ නිපදවන අතර එම තේ එයටම ආවේණික සුවිශේෂී රසයකින් යුක්ත වේ.

## අපගේ නිපැයුම්

### සිටීසී

| | |
|---|---|
| බීපී 1 | පීඩී |
| පී එෆ් 1 | |

### සම්ප්‍රදායික

| | |
|---|---|
| එෆ් බී ඕපී 1 | එෆ් බී ඕ පී එෆ් |
| බී ඕ පී 1 | එෆ් බී ඕ පී එෆ් 1 |
| එෆ් බී ඕ පී | බී ඕ ප |
| ඕ පී 1 | සිල්වර් ටිප් |
| එෆ් බී ඕ පී එෆ් ද. ප. | පෙකෝ |
| ඕ පී | |

## ප්‍රමිතිය

අපගේ තේ ඒවායේ විශ්ෂ්ඨ ගුණාත්මකබව නිසා කීර්තියට පත්ව ඇති අතර පිළිගත් තත්ත්ව සහතික, නිෂ්පාදන වගකීම පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂාව සඳහා සහතික කරනැ ලැබ තිබේ. සියලු නිපැයුම් සහ ක්‍රියාදාම ශ්‍රී ලංකා ප්‍රමිත මණ්ඩලය විසින් නිකුත් කරන ලද ISO 22000:2005 සහ HACCP සමග පූර්ණව අනුකූල වන අතර ඊට අමතරව සියලුම කර්මාන්තශාලාවලට යහපත් නිෂ්පාදන පරිචය (GMP) පිළිබඳ සහතිකකරණය හිමිව තිබේ. සියලු කලු තේ නිෂ්පාදන කර්මාන්තශාලා සඳහා ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය (ISO 22000:2005 සහ HACCP) ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම නිෂ්පාදන වගකීම කෙරෙහි අපගේ වගකීම ශක්තිමත් කරන අතර නිෂ්පාදන ක්‍රියාවලියේ ආරම්භයේ සිට අවසානය දක්වා තත්ත්ව ප්‍රමිති පවත්වා ගනු ලබන බව සහතික කරයි. බැර ලෝහ තිබේද යන්න සොයා බැලීම සඳහා තේවල ගුණාත්මකබව වාර්ෂිකව පරීක්ෂා කරනු ලැබේ. ක්ෂුද්‍ර ජීවවිද්‍යාත්මක නිර්ණායක සහ කෘෂි රසායනික අවසාදිත ISO 3720 ප්‍රමිතියේ අවශ්‍යතාවයන් ප්‍රකාරව වේ.

SLSI ISO 22000 FOOD SAFETY MANAGEMENT SYSTEM CERTIFIED

HACCP SYSTEM CERTIFIED

Sri Lanka Standards GMP Certified Institution



ඔබට මෙම වාර්ෂික වාර්තාව PDF ආකාරයෙන් අපගේ වෙබ් අඩවිය වන *http://www.ktfl.lk//annual report* වෙතින් ලබාගත හැක.

# අපගේ ගමන් මග

## 1992/93

කළුබෝවිටියාන තේ කර්මාන්ත ශාලා සමාගම ස්ථාපිත කරන ලදී.

## 1994/95

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම නිෂ්පාදන මෙහෙයුම් ආරම්භ කරන ලදී.

## 1998/99

ට්‍රාන්ස් වර්ල්ඩ් ස්ටාර් සම්මානය - ආර්ථික විද්‍යා අධ්‍යයන ආයතනය - ඉන්දියාව.

## 2000/01

දෑරංගල තේ කර්මාන්තශාලා සමාගම මෙහෙයුම් ආරම්භ කරන ලදී.

## 2004/05

වසරේ ඉහළම විකුණුම් සාමාන්‍යය.

## 2005/06

සිටීසී පහතරට තේ කාණ්ඩයේ ඉහළම විකුණුම් සාමාන්‍යය - ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස් තේ තැරැව්කාර (පුද්) සමාගම.

## 2006/07

දිවයිනේ වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව
සීටීසී පහතරට කාණ්ඩය - ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස් තේ තැරැව්කාර (පුද්) සමාගම.

## 2009/10

දෙවන ස්ථානය - වැඩිම ඉහළම මිල ගණන් සංඛ්‍යාව
ගෝල්ඩන් කප් සම්මානය.

## 2010/11

වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ - රුසියාව.

## 2011/12

සමස්ත ලංකා සීටීසී තේ වැඩිම ඉහළ මිල සංඛ්‍යාව පහත රට කාණ්ඩය - ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස් තේ තැරැව්කාර (පුද්) සමාගම.

## 2012/13

හිනිදුම තේ කර්මාන්තශාලා සමාගම මෙහෙයුම් ආරම්භ කරන ලදී.

## 2013/14

ජාතික වැවිලි සම්මානය - හොඳම විශාල පරිමාණ තේ කර්මාන්තශාලාව

## 2014/15

වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ - ඩුබායි (ස්වර්ණ සම්මානය සහ රිදී සම්මානය)

## 2015/16

මැණික්දිවෙල තේ කර්මාන්තශාලා සමාගම විවෘත කිරීම

## 2016/17

වසරේ හොඳම ලංකා විශේෂිත වතු තේ - චීනය

## 2017/18

අපගේ නව තේ ඇසුරුම දියත් කරන ලදී

# විශේෂ සිදුවීම්

## විශේෂ මූල්‍ය සිදුවීම්

| මාර්තු 31න් අවසන් වසර සඳහා | වෙනස % | 2017/18 රු. | 2016/17 රු. |
|---|---|---|---|
| ශුද්ධ විකුණුම් | 7 | **1,004,319,623.10** | 935,591,884 |
| විකුණුම් පිරිවැය | 12 | **(983,007,160.69)** | (882,539,795) |
| **දළ ලාභය** | -61 | **21,312,462.41** | 53,052,089 |
| වෙනත් ආදායම | 33 | **26,091,300.53** | 20,368,130 |
| **මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය** | -36 | **47,403,762.94** | 73,420,219 |
| **පරිපාලන සහ ආයතනික වියදම්** | | | |
| විකුණුම් සහ බෙදාහැරීම් සහ අනෙකුත් වියදම් | 24 | **(41,116,894.46)** | (33,262,579) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභය** | -84 | **6,286,868.48** | 40,157,640 |
| මූල්‍ය වියදම් | 44 | **(13,219,529.74)** | (9,164,034) |
| **බදුවලට පෙර ශුද්ධ ලාභය** | -122 | **(6,932,661.26)** | 30,993,606 |
| ආදායම් බදු | -62 | **(654,697.98)** | (1,723,391) |
| **බදුවලට පසු ශුද්ධ ලාභය** | -126 | **(7,587,359.24)** | 29,267,215 |

**ශුද්ධ විකුණුම්** (රු. මිලියන)




**මෙහෙයුම් වියදම්වලට පෙර ලාභය** (රු. මිලියන)




**ආදායම් බදු** (රු. මිලියන)




**බදුවලට පසු ශුද්ධ ලාභය** (රු. මිලියන)



# මූල්‍ය නොවන විශේෂ සිදුවීම්

## කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම

අමු දළු සැපයම්කරුවෝ

1,998

අමු දළු ලබාගැනීම්

3,499,414 කි.ග්‍රෑ

තේ නිෂ්පාදනය

731,750 කි.ග්‍රෑ

## දැරංගල තේ කර්මාන්තශාලා සමාගම

අමු දළු සැපයම්කරුවෝ

727

අමු දළු ලබාගැනීම්

1,474,475 කි.ග්‍රෑ

තේ නිෂ්පාදනය

289,634 කි.ග්‍රෑ

## හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලා සමාගම

අමු දළු සැපයම්කරුවෝ

322

අමු දළු ලබාගැනීම්

1,224,781 කි.ග්‍රෑ

තේ නිෂ්පාදනය

242,955 කි.ග්‍රෑ

## මැණික්දිවෙල තේ කර්මාන්තශාලා සමාගම

අමු දළු සැපයම්කරුවෝ

266

අමු දළු ලබාගැනීම්

1,097,625 කි.ග්‍රෑ

තේ නිෂ්පාදනය

210,107 කි.ග්‍රෑ

KALUBOWITIYANA TEA

මුළු අමු දළු සැපයම්කරුවෝ
3,313

මුළු අමු දළු ලබා ගැනීම්
7,296,295 කි.ග්‍රෑ

මුළු තේ නිෂ්පාදනය
1,474,446 කි.ග්‍රෑ



# සභාපතිගේ සමාලෝචනය

2018 මාර්තු 31න් අවසන් වූ මුල්‍ය වසර සඳහා වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටිනි. ලංකා තේ වලට ලැබුණු වාසිදායක මිල ගණන් යටතේ වුවද, සමාලෝචිත කාල පරිච්ඡේදය ශ්‍රී ලංකා තේ කර්මාන්තයට බෙහෙවින් අභියෝගාත්මක එකක් වුණි. 2015 සිට ඉදිරියට රැගෙන ආ ගෝලීය පරිමාණයෙන් පැවැති සීඝ්‍රයෙන් වෙනස්වන සහ පුරෝකථනය කළ නොහැකි සාර්ව ආර්ථික තත්ත්වයන් සහ 2017/18 අනුරූප වසරේ දෙවන කාර්තුවේ පැවැති අයහපත් කාලගුණය, නිෂ්පාදනයට අදාළව තේ කර්මාන්තයේ මන්දගාමී වර්ධනයට හේතු කාරක විය.

## ගෝලීය අභියෝග

2017 වසර සඳහා වූ මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව ශ්‍රී ලංකා ආර්ථිකය 2016 පැවැති 4.5% ක වර්ධනයට සාපේක්ෂව 3.1%ක මූර්ත දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනයක් වාර්තා කරන ලදී. කෘෂිකර්ම, වනාන්තර සහ ධීවර ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2016 පැවැති 3.8% ට සාපේක්ෂව 2017 දී 0.8%කින් සංකෝචනය වුණි.

අයහපත් කාලගුණ තත්ත්වයන් පෙර වසරේදී මෙන්ම විශේෂයෙන්ම කෘෂිකාර්මික අංශයේ ආර්ථික ක්‍රියාකාරම් කෙරෙහි අහිතකර අන්දමින් බලපාන ලදී. වරෙක දැඩි නියගයද වරෙක අධික වර්ෂාපතනය ද ලෙස කාලගුණය අන්ත දෙක අතර දෝලනය විය. 2017 වසරේ මුල් භාගයේ පැවැති අධික වියළි කාලගුණය හේතුවෙන්, ඉතා අයහපත්වූ පෙර වසරේදී පැවැති කාර්යසාධනයට සමාන තත්ත්වයක් පවත්වා ගැනීමට මහත් ප්‍රයත්නයක් දැරීමට සිදුවුණි. ග්ලයිෆොසේට් වල් නාශකය සීමා කිරිම සහ ශ්‍රම හිඟය හේතුවෙන් තත්ත්වය වඩාත් අයහපත් වූ අතර ඒ සම්බන්ධයෙන් අදාළ සියලු පාර්ශවයන්ගේ අවධානය යොමුවිය යුතුය.2017 වසරේ සමස්ත තේ නිෂ්පාදනය 2016 වසරේ 11.2%ක අඩුවීමට සාපේක්ෂව 4% ක වර්ධනයක් වාර්තා කරන ලදී. 2016 දි අනුපිළිවෙලින් 4.7%ක් සහ 5.8%ක් වූ සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ කර්මාන්ත අංශයේ වර්ධනය 2017දී 3.25%කින් සහ 3.9% කින් වර්ධනය විය. 2017 වසරේ අග භාගයේදී දුර්වල මුදල් ඒකක, විවිධ ආකාරයේ සම්බාධක සහ අයහපත් වෙමින් පැවති අර්බුද ආදියේ ප්‍රතිඵලයක් ලෙස ලංකාවේ ප්‍රධානතම තේ ගැනුම්කරුවන් සය දෙනා අඛණ්ඩව අර්බුදයන්ට හා අවහිරයන්ට මුහුණ දෙන ලදී.

පසුගිය වසර හතරක කාලය තුළ රුසියාව රූබලය සියයට 100කට වැඩි ප්‍රමාණයකින් අවප්‍රමාණය කර තිබෙන අතර තුර්කියේ ලීරාව එක් වසරක් තුළ 40% ක අවප්‍රමාණයකට බඳුන් කරන ලදී. එම අවස්ථා දෙකෙහිම ඒ හේතු කොට ගෙන එම රටවල ක්‍රය ශක්තිය බරපතල ලෙස හීන විය. ඒ අනුව රුසියානු ෆෙඩරේෂණය දැඩි පීඩනයකට ලක්ව ඇති අතර එහි ප්‍රතිඵලය ලෙස අනාගතයේ ඔවුන් ලංකාවෙන් තේ මිලදී ගැනීම සීමා වනු ඇත.

## සමාගමේ කාර්යසාධනය

මෙම අභියෝගාත්මක පසුබිම මධ්‍යයෙහි වුවද, පිරිවැටුමෙහි 7.34%ක වර්ධනයක් සනිටුහන් කරමින් සමාගම සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 1,004 ක ආදායමක් සහ රු.මිලියන 7.58 ක පශ්චාත් බදු ලාභයක් සමාගම වාර්තා කරන ලදී.

## අපගේ උපායමාර්ගය

ගුණාත්මකබවින් ඉහළ නිමි නිෂ්පාදන නිපැයුම පිණිස අපගේ මූලික ඉලක්කය පහත දැක්වෙන් යහපත් නිෂ්පාදන පරිචයන්ගෙන් සමන්විත වේ. මෙම සංදර්භය තුළ, සමාගමේ අවසන් අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අමුද්‍රව්‍ය, පිරිසැකසුම සහ අලෙවිකරණය මත ගුණාත්මක පරාමිතීන් සඳහා කළමනාකාරිත්වය නායකත්වය ලබා දෙයි. උපායමාර්ගික දෘෂ්ඨියෙන් ගත්කළ, අස්වැන්න ඉහළ නැංවීමේ ප්‍රයත්නයක් ලෙස යහපත් කෘෂිකාර්මික සහනිෂ්පාදන පරිචයන් සම්බන්ධයෙන් කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීමට හා දැනුම ඉහළනැංවීමට හා එමගින් අවසාන නිෂ්පාදිතයට වඩා ඉහළ අධිමිලක් එක් කිරිමට සමාගම අදහස්කරයි. රන්දළු සමිති හඳුන්වාදීම මගින් කුඩා තේ වතු අංශය සමග යහපත් සබඳතා ඇති කරගැනීමට සමාගම අදහස් කරන අතර දේශීය සන්නාමයක් හඳුන්වා දීම ඉදිරි සම්භාවිතාවයකි. දැනුවත්බව හා අවබෝධය පුවල් කිරීමේ ක්‍රමයක් ලෙස, දැනුම වර්ධනය හා සමස්ත ඵලදායීතාවය වර්ධනය කිරීම පිණිස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව සිය විධායක කාර්යමණ්ඩලය සහසේවකයන් සඳහා අදාළ පුහුණුවැඩසටහන් පැවැත්වීමට නියමිතය. ශක්තිමත් මූලධර්ම මත සමාගම අඛණ්ඩව සිය මෙහෙයුම් පවත්වාගෙන යන අතර සේවක පිරිස තම වටිනාමවත්කම සේ සලකයි.

**ශක්තිමත් මූලධර්ම මත සමාගම අඛණ්ඩව සිය මෙහෙයුම් පවත්වාගෙන යන අතර සේවක පිරිස තම වටිනාම වත්කම සේ සලකයි.**

## අනාගත අපේක්ෂා

ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තය අභියෝගාත්මක එකක් සේ පෙනේ. බහුතරයක් තෙල් නිෂ්පාදන රටවල් වන අපගේ ප්‍රධාන පෙළේ ගැනුම්කාර වෙළඳපොළ තුළ පවත්නා අභ්‍යන්තර සහ වෙළඳ තත්වයන් තීරණාත්මක සාධක වේ. හීන වෙමින් පවතින රූබලයේ අගය සහ පහත වැටෙමින් පවතින තෙල් මිල කෙරෙහි දැඩි අවධානයෙන් පසු විය යුතුය. ධනාත්මක සාධකයක් වනුයේ, වාසිදායක තීරු බදු සහන ලබා ගැනීමට හැකියාව ඇති වන ලෝක වෙළඳ සංවිධානයේ සාමාජිකත්වය 2014 වසරේදී රුසියාව හිමිකර ගැනීමයි. සම්බාධක පැනවීමට පෙර ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම තේ ගැනුම්කරුවා වු ඉරානය සහ එක්සත් ජනපදය අතර උණුසුම්කාරී තත්වයේ අඩුවීමත් සමග ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ හිමිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, පොදුවේ මැද පෙරදිග පවතින සමාජ-ආර්ථික අර්බුදය කණස්සල්ලට හේතුවන කරුණක් වී තිබේ.

දේශීය වශයෙන් ගත් කළ, දේශගුණික තත්වයන්, කම්කරු වැටුප් සහ පොහොර සහනාධාරය අභියෝගයක් ලෙස දිගටම පවතින අතර ඒ සඳහා වඩා හොඳ කළමනාකරණයක් අවශ්‍ය වේ. වසර පුරාම ආකාර්ෂණීය සහ නොකඩවා පොහොර සහනාධාරය ලබා දුන්න ද, කුඩා තේ වතු හිමියන් මුහුණ පා ඇති අභියෝගයක් වනුයේ අහිතකර කාලගුණ තත්ත්වයන් නිසා නිසි කලට වේලාවට පොහොර යෙදීමයි. අප හමුවේ පවතින දැවැන්ත අභියෝග පිළිබඳව මනාව දැනුවත් වෙමින් අප සුබවාදීව වර්ෂය කරා පිවිසුනෙමු. මේ දක්වා එම දුෂ්කරතාවයන්ට සාර්ථකව මුහුණ දෙමින් කර්මාන්තයේ පවතින අපහසු තත්ත්වයන් මධ්‍යයයේ වෘත්තීයභාවයෙන් සහ උපායාමාර්ගික ඉලක්කයක් සහිතව අප ජයග්‍රහණ ගණනාවක් අත්කර ගැනීමට සමත් වූයෙමු. එළඹෙන වසරේදී ද වඩා කාර්ය ශූරත්වයෙන් යුතුව ඒ හා සමාන ප්‍රවේශයක් අනුගමනය කළහොත් භාණ්ඩ වෙළඳපොළේ වෙනස්වනසුළු තත්ත්වයන්, ප්‍රධාන අපනයන වෙළඳපොළවල අස්ථාවරත්වය, කාලගුණික වෙනස්කම් සහ ඵලදායිතාව හා නොබැඳුණු වැටුප් වැඩිවීම් සඳහා වන ඉල්ලුම මගින් මතුවන කෙටි කාලින සහ මධ්‍ය කාලීන බලපෑම් තුලනය කිරීමට අපට හැකිවනු ඇත.

## ස්තූතිය

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්, අපගේ කටයුතුවල සාර්ථකත්වය සඳහා අප විශ්වාසය තබා කටයුතු කරන කුඩා තේ වතු හිමි අංශය මෙන්ම අපගේ මෙහෙයුම් සාර්ථකව අඛණ්ඩව ඉදිරියට මෙහෙයවන කළුබෝවිටියානේ අපගේ කාර්ය මණ්ඩලය සහ කළමනාකාරිත්වය වෙත මාගේ ප්‍රසාදය පළකරමි. සැම අවස්ථාවකම අප වෙත උපදෙස් මාර්ගෝපදේශ ලබා දෙමින් දැක්වූ නොමසුරු සහයෝගය වෙනුවෙන් වැවිලි කර්මාන්ත අමාත්‍ය ගරු නවින් දිසානායක මැතිතුමාට සහ අමාත්‍යාංශයේ ලේකම්තුමාට සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ නිලධාරින්ට මෙන්ම කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාගේ ස්තූතිය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි. අපගේ තේ සඳහා නියම වටිනාකමක් නිරන්තරයෙන් ලබා දෙන සියලු තේ තැරැව්කාර සමාගම් සහ අපගේ නිෂ්පාදන මිලදී ගන්නන් ලබා දුන් සහයෝගය අප බෙහෙවින් අගය කරන්නෙමු. එළඹෙන වසර බොහෝ අංශවලින් අභියෝග පිරි එකක්වුවද, විශ්වාසයෙන් යුතුව ඉදිරියට යාමේ අධිෂ්ඨානය අප වෙත ලබා දෙන අපගේ සේවකයන්ගේ, පාර්ශවකරුවන් සහ ඔවුන්ගේ ශක්තිමත් හවුල්කාරිත්වයේ ශක්තිය හා පක්ෂපාතිත්වයෙන් මම විශ්වාසය ලබන්නෙමි.



**පී එස් සමරකෝන්**
සභාපති

# අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| පී එස් සමරකෝන් මහතා | සභාපති |
| අයි සුගතදාස මිය | අධ්‍යක්ෂ |
| එච් එච් කස්තුරිආරච්චි මයා | අධ්‍යක්ෂ |
| පී රාසයියා මයා | අධ්‍යක්ෂ |
| ටී පී රත්නායක මයා | අධ්‍යක්ෂ |
| එම් ඒ එල් එස් එන් කේ මන්ත්‍රීනායක මයා | අධ්‍යක්ෂ |
| ඒ යූ සී අතුකෝරාළ මයා | අධ්‍යක්ෂ |
| ධම්මික අඹේවෙල මයා | අධ්‍යක්ෂ |
| ජී නල්ලපෙරුම මයා | අධ්‍යක්ෂ |
| කේ බ්‍රාහ්මන මයා | අධ්‍යක්ෂ |

# ආයතනික කළමනාකාරීත්වය

| | |
|---|---|
| එම්.එන් ජයවර්ධන මහතා | කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි. |
| ටී ඩබ්ලිව් එම් එස් පී බණ්ඩාර මහතා | කළමනාකරු/පරිපාලන හා මානව සම්පත් |
| පී දෙහිවලගේ මහතා | වැඩ බලන කළමනාකරු/මූල්‍ය |
| ටී ඒ ඩී ජේ සී තිලකරත්න මහතා | කළමනාකරු/කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව |
| ටී සිරිවර්ධන මහතා | කළමනාකරු/දෑරංගල තේ කර්මාන්තශාලා සමාගම |
| එස් ඒ එන් ආර් සුබසිංහ මහතා | කළමනාකරු/හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව |
| එච් එම් ජේ එන් වීරකෝන් මහතා | කළමනාකරු/මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව |

# සංවිධාන ව්‍යුහය


සභාපති/අධ්‍යක්ෂ මණ්ඩලය
කළමනාකරණ අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.
කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන)
කළමනාකරු (මූල්‍ය සහ අලෙවි)
සහකාර කළමනාකරු අලෙවි
සහකාර කළමනාකරු මූල්‍ය
අභ්‍යන්තර ගණන නිලධාරී
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
සභාපතිගේ ලේකම්
රියැදුරු
කාර්යාල කාර්ය සහායක


කර්මාන්තශාලා කළමනාකරු
සහකාර කර්මාන්තශාලා කළමනාකරු
කර්මාන්තශාලා නිලධාරීන්
ප්‍රධාන ලිපිකරු
ව්‍යාප්ති නිලධාරී
ජ්‍යෙෂ්ඨ සහායක කර්මාන්තශාලා නිලධාරී
ජ්‍යෙෂ්ඨ සහකාර ලිපිකරු
සහකාර කර්මාන්තශාලා නිලධාරී
සහකාර ලිපිකරු
ගබඩා පාලක
විදුලි කාර්මික/ කාර්මික ශිල්පී
කණිෂ්ඨ සහායක කර්මාන්තශාලා නිලධාරී
කණිෂ්ඨ ලිපිකරු
මුරකරු
රියැදුරු
දෛනික වැටුප්ලාභීන්



# කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය


| | |
|---|---|
| **මෙහෙයුම් තොරතුරු** | 16 |
| කර්මාන්තශාලා අනුව ලාභ/(අලාභ) | 18 |
| මාසික තේ නිෂ්පාදනය | 19 |
| වාර්ෂික තේ නිෂ්පාදනය | 20 |
| මාසික අමු දළු ලබාගැනීම් | 21 |
| වාර්ෂික අමු දළු ලබාගැනීම් | 22 |
| සංසන්දනාත්මක තොරතුරු - නිෂ්පාදනය | 24 |
| විකුණුම් සාමාන්‍යය සහ උන්නතාංශය සැසඳීම | 26 |
| ඉහළම මිල ගණන් - 2017/18 | 28 |
| ජයග්‍රහණ - 2017/18 | 29 |
| **මූල්‍ය ප්‍රාග්ධනය** | 30 |
| **මානව ප්‍රාග්ධනය** | 31 |
| **සමාජ ප්‍රාග්ධනය** | 32 |
| **අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව** | 33 |

# මෙහෙයුම් තොරතුරු



## ප්‍රධාන කාර්යාලය

| | | | | | |
|---|---|---|---|---|---|
| ලිපිනය | අංක. 556, නාගහමුල්ල, පන්නිපිටිය පාර, පැලවත්ත, තලංගම දකුණ, ශ්‍රී ලංකාව. | | | | |
| මානව සම්පත් | කළමනාකාර අධ්‍යක්ෂ | – 1 | අභ්‍යන්තර විගණන නිලධාරී | – | 1 |
| | කළමනාකරු මූල්‍ය සහ අලෙවි | – 1 | කළමනාකරණ සහකාර | – | 10 |
| | කළමනාකරු/පරිපාලන සහ මා.ස. | – 1 | කාර්යාල කාර්ය සහායක | – | 5 |
| | සහකාර කළමනාකරු මූල්‍ය | – 1 | රියදුරු | – | 3 |



## කළුබෝවිටියාන සිටිසී තේ කර්මාන්තශාලාව

| | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | මාතර | උප දිස්ත්‍රික්කය | මොරවක |
| ගම | කළුබෝවිටියාන | උන්නතාංශය | පහත රට |
| වෙළඳ ලකුණ | කළුබෝවිටියාන | නිෂ්පාදනය වර්ගය | සිටිසී තේ |
| මානව සම්පත් | කර්මාන්තශාලා කළමනාකරු – 1 | | |
| | සහකාර කර්මාන්තශාලා කළමනාකරු – 1 | | |
| | කාර්යාල කාර්ය මණ්ඩලය – 7 | | |
| | කර්මාන්තශාලා කාර්යමණ්ඩලය – 21 | | |

## දෑරංගල තේ කර්මාන්තශාලාව

| | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | මාතර | උප දිස්ත්‍රික්කය | මොරවක |
| ගම | කිරිවැල්කැලේ | උන්නතාංශය | පහත රට |
| වෙළඳ ලකුණ | දෑරංගල/ කිරිවැල්කැලේ | නිෂ්පාදනය වර්ගය | සම්ප්‍රදායික තේ |
| මානව සම්පත් | කර්මාන්තශාලා කළමනාකරු – 1 | | |
| | සහකාර කර්මාන්තශාලා කළමනාකරු – 1 | | |
| | කාර්යාල කාර්ය මණ්ඩලය – 4 | | |
| | කර්මාන්තශාලා කාර්යමණ්ඩලය – 14 | | |



## හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව

| | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | ගාල්ල | උප දිස්ත්‍රික්කය | තවලම |
| ගම | ජැස්මින් වැලි | උන්නතාංශය | පහතරට |
| වෙළඳ ලකුණ | හිනිදුම හිල්ස්/ තවලම හිල්ස් | නිෂ්පාදනය වර්ගය | සම්ප්‍රදායික තේ |
| මානව සම්පත් | සහකාර කර්මාන්තශාලා කළමනාකරු – 1 | | |
| | කාර්යාල කාර්ය මණ්ඩලය – 5 | | |
| | කර්මාන්තශාලා කාර්යමණ්ඩලය – 15 | | |





## මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව

| | | | |
|---|---|---|---|
| දිස්ත්‍රික්කය | මහනුවර | උප දිස්ත්‍රික්කය | යටිනුවර |
| ගම | මැණික්දිවෙල | උන්නතාංශය | බස්නාහිර මධ්‍ය |
| වෙළඳ ලකුණ | මැණික්දිවෙල | නිෂ්පාදනය වර්ගය | සම්ප්‍රදායික තේ |
| මානව සම්පත් | කර්මාන්තශාලා කළමනාකරු – 1 | | |
| | කාර්යාල කාර්ය මණ්ඩලය – 4 | | |
| | කර්මාන්තශාලා කාර්යමණ්ඩලය – 8 | | |

# කර්මාන්තශාලා අනුව ලාභ/අලාභ

## කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව

ප්‍රදේශයේ පැවැති අයහපත් කාලගුණික තත්ත්වයන් මධ්‍යයේවුවද, 2017/18 මූල්‍ය වර්ෂය තුළදී කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව කිලෝ ග්‍රෑම් 3,499,414ක ඵලදාවක් ලබා ගැනීමට සමත්වූ අතර එය ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ඵලදාව වූ කිලෝ ග්‍රෑම් 4,800,000 න් 72.90% ක් ලෙසවාර්තා වුණි. ගෝලීය වෙළඳපොළ තත්වයන්හි අනපේක්ෂිතව මිල පහළ යාමේ ප්‍රවණතාවනිසාවෙන් නොවැළැක්විය හැකි පරිදිමඅමුදළු ලබාගැනීම පිණිස කර්මාන්තශාලා අතර දැඩි තරඟකාරීත්වයක් පැවැති නමුත් 2017/18 වර්ෂය තුලදීද අඛණ්ඩව ප්‍රදේශයේ ඉහළම මිල ගෙවනු ලැබූයේ කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම වන අතර එමගින් කුඩා තේ වතු හිමියන්ට උසස් තත්ත්වයේ දළු සමාගමට සැපයීමට පෙළඹවීමක් ඇති කරන ලදී. 2017 ඔක්තෝබර් මාසයේදී සමාගම කුඩා තේ වතු හිමියන්ට ගෙවූ මිල රු. 117.42ක් වූ අතර එය ශ්‍රී ලංකා ඉතිහාසයේ සමාගමක් විසින් ගෙවන ලද ඉහළම මිල ලෙස වාර්තා ගත විය.

සිය ඉහළම ශේණිය වන PF1 සඳහා කර්මාන්තශාලාවට 2017/18 වසරේදී ඉහළම මිල ගණන් 20 ලබා ගැනීමට හැකි වූ අතර එසේ ඉහළ මිල ගණන් ලබා ගැනීම වෙනුවෙන් එයට දේශීයව මෙන් ජාත්‍යන්තරව ද සම්මාන දිනා ගැනීමට සමත් විය.

මූල්‍ය වර්ෂය තුළදී කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව කැපී පෙනෙන අන්දමින් රු. මිලියන 76.03ක ලාභයක් ලබා ගැනීමට සමත් වූ අතර එය සමාගම සිය ඉතිහාසයේ වාර්තා කරන ලද දෙවන වැඩිම ලාභය විය. තම කර්මාන්තශාලාවට කුඩා තේ වතු හිමියන් සැපයූ අමු දළු සඳහා සාධාරණ මිලක් ගෙවීම මගින් ඔවුන්ගේ ආදායම හා ජීවන මට්ටම ඉහළ නැංවීම මගින් කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව දායක විය.

## දෑරංගල තේ කර්මාන්තශාලාව

ඇස්තමේන්තුගත ඵලදාව වූ කිලෝ ග්‍රෑම් 1,977,000ට සාපේක්ෂව දෑරංගල තේ කර්මාන්තශාලාව කිලෝ ග්‍රෑම් 1,474,475ක් ලබා ගැනීමට සමත්වුවද, 2017/18 මූල්‍ය වර්ෂය අවසානයේදී එය රු. මිලියන 23.5 ක සැලකිය යුතු අලාභයක් වාර්තා කරන ලදී. මෙම අයහපත් ප්‍රතිඵලය සඳහා බල පෑ එක් හේතුවක් වූයේ උසස් තත්ත්වයේ අමු දළු සැපයුම සීමා වීමයි. එසේම එය අභියෝගාත්මක ද විය. එසේම අපේක්ෂිත උසස් මට්ටමේ තේ දළු සඳහා කර්මාන්තශාලා අතර පැවැති තරඟකාරිත්වය ද මේ සඳහා හේතු විය.

උසස් තත්ත්වයේ අමු දළු ලබාගැනීමේදී සමාගම මුහුණ දුන් ගැටළුව කළමනාකාරිත්වය විසඳා ඇති අතර මෙම ඒකකයේ ලාභ ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා උපාය මාර්ග සකස් කිරීමේ කාර්යය නිරතව සිටී.

## හිනිදුම තේ කර්මාන්තශාලාව

අයහපත් දේශගුණික තත්වයන් හේතු කොට ගෙන කර්මාන්තශාලාව දළු කිලෝ ග්‍රෑම් 1,224,781 ක් පමණක් වාර්තා කළ අතර එය ඇස්තමේන්තුගත ඵලදාවෙන් 72.04% ක් පමණි. වර්ෂය තුළදී නව දළු සැපයුම් මාර්ග හඳුන්වාදීමට කර්මාන්තශාලා කළමනාකාරිත්වය උත්සාහ දැරූ අතර එමගින් ඉදිරි කාල සමයේදී ලබා ගන්නා දළු ප්‍රමාණය ඉහළ නැංවෙනු ඇත. රු. 560.62ක් වූ නිෂ්පාදන පිරිවැය අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ අතර ඒ සඳහා හේතුවූයේ කන්නය සඳහා අපේක්ෂිත ඵලදාව නොලැබීමයි.

සමාගමේ අරමුණ වනුයේ උන්නතාංශ සාමාන්‍යයට ඉහළ ශුද්ධ විකුණුම් සාමාන්‍යයක් ලබා ගැනීම පිණිස ගුණාත්මක බවින් යුතු දළු පමණක් බාර ගැනීමයි.

## මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව

අයහපත් දේශගුණික තත්වයන් හේතු කොට ගෙන කර්මාන්තශාලාව දළු කිලෝ ග්‍රෑම් 1,097,625 ක් පමණක් වාර්තා කළ අතර එය ඇස්තමේන්තුගත ඵලදාවෙන් 61.13% ක් පමණි. මෙම වසරේදී සමාගම රු. මිලියන 21.47ක අලාභයක් වාර්තා කළ අතර ඒ සඳහා හේතු ගණනාවක් බලපාන ලදී. උසස් තත්ත්වයේ දළු ලබාගැනීමේ අපහසුතාව, තරඟකාරී අනෙකුත් කර්මාන්තශාලා විසින් ගෙවන ලද කෘතිම මල ගණන් සහ සේවකයන්ට අවශ්‍ය නිපුණතා නොමැතිවීම ඒ අතුරින් කිහිපයක් වන අතර ඒවාට පිළියම් යෙදීමට කළමනාකාරිත්වය කටයුතු යොදමින් සිටී. ඉදිරි කාලයේදී සැලකිය යුතු මට්ටමේ නිමි නිෂ්පාදනයක් නිපදවීමට සහ ඒ සඳහා ඉහළ මිලක් ලබාගැනීමට හැකිවනු ඇති බවත් එමගින් සමාගමට ලාභ ලබා ගැනීමට හැකිවනු ඇති බවත් කළමනාකාරිත්වය අපේක්ෂා කරයි.

| | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව රු. | දෑරංගල තේ කර්මාන්තශාලාව රු. | හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව රු. | මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව රු. |
|---|---|---|---|---|
| **ආදායම** | | | | |
| දළ විකුණුම් | 471,697,009.75 | 201,378,939.39 | 150,126,825.86 | 118,073,430.00 |
| තැරව්කාර ගාස්තු හා විකුණුම් වියදම් | (6.721,913.14) | (2,238,711.87) | (2,165,050.20) | (1,993,055.73) |
| ශුද්ධ විකුණුම් | 464,975,096.61 | 199,140,227.52 | 147,961,775.66 | 116,080,374.27 |
| එකතු කළා - දේශීය විකුණුම් | 28,584,354.87 | 9,647,444.00 | 1,379,688.00 | 1,420,105.00 |
| මුළු ආදායම | 493,559,451.48 | 208,787,671.52 | 149,341,463.66 | 117,500,479.27 |
| මිලදී ගත් දළු | 365,823,985.62 | 146,034,388.15 | 118,761,884.04 | 90,989,485.60 |
| නිෂ්පාදන පිරිවැය | 64,111,166.72 | 38,356,670.80 | 37,124,799.25 | 28,885,325.00 |
| පොදු ගාස්තු | 31,677,679.75 | 19,951,983.50 | 14,669,270.70 | 17,046,905.61 |
| එකතු කළා: ආරම්භක තොග | 42,152,309.55 | 46,079,098.82 | 7,112,401.40 | 14,678,484.40 |
| අඩුකළා: අවසන් තොග | (86,240,269.20) | (18,117,478.38) | (17,893,265.54) | (12,628,909.76) |
| | 417,524,872.44 | 232,304,662.89 | 159,775,089.85 | 138,971,290.85 |
| ලාභ/(අලාභ) | 76,034,579.04 | (23,516,991.37) | (10,433,626.19) | (21,470,811.58) |

# මාසික තේ නිෂ්පාදනය

| මාසය | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්) | දෑරංගල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්) | හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්) | මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්) | එකතුව (කිලෝ ග්‍රෑම්) |
|---|---|---|---|---|---|
| අප්‍රේල් 2017 | 75,931 | 43,590 | 20,458 | 28,064 | 168,043 |
| මැයි | 66,299 | 36,297 | 19,167 | 21,243 | 143,006 |
| ජූනි | 59,073 | 28,623 | 26,251 | 20,607 | 134,554 |
| ජූලි | 42,385 | 19,114 | 27,563 | 18,258 | 107,320 |
| අගෝස්තු | 45,501 | 20,395 | 28,696 | 16,144 | 110,736 |
| සැප්තැම්බර් | 44,787 | 20,347 | 16,220 | 15,749 | 97,103 |
| ඔක්තෝබර් | 53,906 | 18,780 | 15,277 | 17,529 | 105,492 |
| නොවැම්බර් | 59,619 | 18,514 | 14,066 | 14,538 | 106,737 |
| දෙසැම්බර් | 61,894 | 18,875 | 16,049 | 15,182 | 112,000 |
| ජනවාරි 2018 | 69,831 | 20,689 | 17,263 | 18,085 | 125,868 |
| පෙබරවාරි | 59,163 | 18,403 | 16,228 | 11,092 | 104,886 |
| මාර්තු | 93,302 | 26,008 | 25,717 | 13,616 | 158,643 |
| **එකතුව** | 731,691 | 289,635 | 242,955 | 210,107 | 1,474,388 |

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)




දෑරංගල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)




හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)




මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)



# වාර්ෂික තේ නිෂ්පාදනය

| වර්ෂය | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්) | දෑරංගල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්) | හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්) | මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්) | එකතුව (කිලෝ ග්‍රෑම්) |
|---|---:|---:|---:|---:|---:|
| 1994/95 | 536,780 | – | – | – | 536,780 |
| 1995/96 | 1,038,739 | – | – | – | 1,038,739 |
| 1996/97 | 1,082,973 | – | – | – | 1,082,973 |
| 1997/98 | 1,194,418 | – | – | – | 1,194,418 |
| 1998/99 | 809,741 | – | – | – | 809,741 |
| 1999/00 | 884,197 | 14,584 | – | – | 898,781 |
| 2000/01 | 914,433 | 494,894 | – | – | 1,409,327 |
| 2001/02 | 954,905 | 536,601 | – | – | 1,491,506 |
| 2002/03 | 1,039,447 | 636,762 | – | – | 1,676,209 |
| 2003/04 | 1,154,969 | 488,915 | – | – | 1,643,884 |
| 2004/05 | 1,173,659 | 361,154 | – | – | 1,534,813 |
| 2005/06 | 1,161,031 | 348,651 | – | – | 1,509,682 |
| 2006/07 | 1,272,903 | 278,828 | – | – | 1,551,731 |
| 2007/08 | 1,097,681 | 320,512 | – | – | 1,418,193 |
| 2008/09 | 967,631 | 227,617 | – | – | 1,195,248 |
| 2009/10 | 950,347 | 222,824 | – | – | 1,173,171 |
| 2010/11 | 994,746 | 269,314 | – | – | 1,264,060 |
| 2011/12 | 1,170,972 | 240,901 | – | – | 1,411,873 |
| 2012/13 | 1,110,907 | 254,706 | 168,425 | – | 1,534,038 |
| 2013/14 | 995,844 | 281,666 | 146,031 | – | 1,423,541 |
| 2014/15 | 943,706 | 315,854 | 171,751 | – | 1,431,311 |
| 2015/16 | 994,541 | 460,860 | 219,765 | 117,017 | 1,792,183 |
| 2016/17 | 811,708 | 429,382 | 253,157 | 209,464 | 1,703,711 |
| 2017/18 | 731,750 | 289,634 | 242,955 | 210,107 | 1,474,446 |
| **එකතුව** | 23,988,028 | 6,473,659 | 1,202,084 | 536,588 | 32,200,359 |

සමාගමේ වාර්ෂික තේ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් මිලියන)



# මාසික අමු දළු ලබාගැනීම

| මාසය | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව | | දෑරංගල තේ කර්මාන්තශාලාව | | හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව | | මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සැපයුම්කරුවන් සංඛ්‍යාව | සපයන ලද ප්‍රමාණය කිලෝ ග්‍රෑම් | සැපයුම්කරුවන් සංඛ්‍යාව | සපයන ලද ප්‍රමාණය කිලෝ ග්‍රෑම් | සැපයුම්කරුවන් සංඛ්‍යාව | සපයන ලද ප්‍රමාණය කිලෝ ග්‍රෑම් | සැපයුම්කරුවන් සංඛ්‍යාව | සපයන ලද ප්‍රමාණය කිලෝ ග්‍රෑම් | සැපයුම්කරුවන් සංඛ්‍යාව | සපයන ලද ප්‍රමාණය කිලෝ ග්‍රෑම් |
| අප්‍රේල් 2017 | 2,017 | 352,839 | 707 | 217,948 | 196 | 105,737 | 265 | 139,619 | 3,185 | 816,143 |
| මැයි | 1,994 | 314,956 | 668 | 180,571 | 203 | 99,173 | 263 | 106,316 | 3,128 | 701,016 |
| ජූනි | 1,943 | 288,722 | 671 | 158,945 | 230 | 130,592 | 255 | 108,142 | 3,099 | 686,401 |
| ජූලි | 1,796 | 202,006 | 645 | 100,596 | 249 | 137,726 | 254 | 95,645 | 2,944 | 535,973 |
| අගෝස්තු | 1,793 | 219,001 | 650 | 105,269 | 285 | 147,121 | 246 | 94,972 | 2,974 | 566,363 |
| සැප්තැම්බර් | 1,757 | 218,448 | 645 | 103,612 | 273 | 83,867 | 239 | 85,036 | 2,914 | 490,963 |
| ඔක්තෝබර් | 1,834 | 265,726 | 662 | 97,940 | 291 | 76,609 | 266 | 92,220 | 3,053 | 532,495 |
| නොවැම්බර් | 1,862 | 301,600 | 678 | 95,234 | 263 | 70,604 | 265 | 76,708 | 3,068 | 544,146 |
| දෙසැම්බර් | 1,867 | 305,684 | 684 | 96,541 | 265 | 81,968 | 264 | 79,492 | 3,080 | 563,685 |
| ජනවාරි 2018 | 1,884 | 314,670 | 690 | 99,944 | 251 | 85,520 | 265 | 87,237 | 3,090 | 587,371 |
| පෙබරවාරි | 1,860 | 277,619 | 673 | 88,569 | 234 | 79,867 | 247 | 60,146 | 3,014 | 506,201 |
| මාර්තු | 1,988 | 438,143 | 727 | 129,306 | 322 | 125,997 | 259 | 72,092 | 3,296 | 765,538 |

කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)




දෑරංගල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)




හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)




මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව (කිලෝ ග්‍රෑම්)



# වාර්ෂික අමු තේ දළු ලබාගැනීම

| වර්ෂය | කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව | | | දෑරංගල තේ කර්මාන්තශාලාව | | |
|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | මිල රු. | ගෙවූ මුදල රු. | ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | මිල රු. | ගෙවූ මුදල රු. |
| 1994/'95 | 2,539,978 | 11.65 | 29,587,982.13 | – | – | – |
| 1995/'96 | 4,758,850 | 13.50 | 64,251,776.63 | – | – | – |
| 1996/'97 | 5,011,298 | 16.76 | 83,946,849.41 | – | – | – |
| 1997/'98 | 5,619,161 | 21.49 | 120,746,103.55 | – | – | – |
| 1998/'99 | 3,764,498 | 20.99 | 79,009,251.87 | – | – | – |
| 1999/'00 | 4,092,958 | 20.54 | 84,059,716.54 | 68,377 | 21.00 | 1,435,917.00 |
| 2000/'01 | 4,225,019 | 24.73 | 104,493,119.37 | 2,283,999 | 23.21 | 53,001,315.79 |
| 2001/'02 | 4,406,549 | 25.76 | 113,531,489.13 | 2,452,187 | 23.33 | 57,224,296.34 |
| 2002/'03 | 4,779,581 | 27.06 | 129,321,153.69 | 3,042,878 | 22.67 | 68,985,911.36 |
| 2003/'04 | 5,316,428 | 29.28 | 155,642,831.99 | 2,274,012 | 23.82 | 54,158,850.23 |
| 2004/'05 | 5,464,753 | 34.08 | 186,241,089.52 | 1,727,312 | 27.70 | 47,847,765.77 |
| 2005/'06 | 5,362,732 | 36.30 | 194,683,064.10 | 1,688,298 | 29.11 | 49,302,770.60 |
| 2006/'07 | 5,859,734 | 38.43 | 225,182,103.24 | 1,339,562 | 32.28 | 43,239,914.14 |
| 2007/'08 | 5,061,084 | 51.08 | 258,498,237.53 | 1,559,138 | 46.93 | 73,165,311.51 |
| 2008/'09 | 4,455,756 | 53.57 | 238,716,305.27 | 1,129,629 | 46.22 | 52,214,017.57 |
| 2009/'10 | 4,406,749 | 62.57 | 275,722,181.37 | 1,114,004 | 57.22 | 63,746,050.83 |
| 2010/'11 | 4,634,137 | 66.28 | 307,172,293.98 | 1,359,341 | 59.29 | 80,593,192.05 |
| 2011/'12 | 5,421,437 | 69.59 | 377,269,886.08 | 1,136,937 | 58.20 | 64,713,552.59 |
| 2012/'13 | 5,161,301 | 71.16 | 367,260,153.59 | 1,243,421 | 64.55 | 80,264,641.77 |
| 2013/'14 | 4,638,578 | 80.13 | 374,733,726.05 | 1,386,298 | 74.78 | 103,673,719.50 |
| 2014/'15 | 4,446,200 | 76.98 | 342,285,327.53 | 1,539,561 | 72.58 | 111,742,927.78 |
| 2015/'16 | 4,774,872 | 65.73 | 313,847,559.85 | 2,249,785 | 61.38 | 138,094,577.16 |
| 2016/'17 | 3,941,813 | 83.24 | 328,101,039.57 | 2,113,499 | 81.96 | 173,224,141.40 |
| 2017/'18 | 3,499,414 | 104.54 | 365,832,985.62 | 1,474,475 | 99.04 | 146,034,388.15 |

වාර්ෂික අමු දළු (කිලෝ ග්‍රෑම් මිලියන)



| හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව | | | මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව | | |
|---|---|---|---|---|---|
| ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | මිල රු. | ගෙවූ මුදල රු. | ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්) | මිල රු. | ගෙවූ මුදල රු. |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| – | – | – | – | – | – |
| 838,887 | 65.05 | 54,569,118.77 | – | – | – |
| 731,251 | 75.77 | 55,409,906.20 | – | – | – |
| 834,380 | 72.16 | 60,205,968.18 | – | – | – |
| 1,095,511 | 59.46 | 65,134,943.29 | 542,106 | 58.77 | 31,857,497.17 |
| 1,235,080 | 81.32 | 100,442,354.51 | 1,033,573 | 67.62 | 69,894,090.60 |
| 1,224,781 | 96.97 | 118,761,884.04 | 1,097,625 | 82.90 | 90,989,485.60 |

# සංසන්දනාත්මක තොරතුරු - නිෂ්පාදනය

## පහතරට සීටීසී සහ ජාතික සීටීසී තේ නිෂ්පාදනයට සපයනු ලැබූ දායකත්වය

| මාසය | සීටීසී | | කළුබෝවිටියාන නිෂ්පාදනය* | නිෂ්පාදන දායකත්වය | |
|---|---|---|---|---|---|
| | පහත රට (කිලෝ ග්‍රෑම් '000) | ජාතික (කිලෝ ග්‍රෑම් '000) | (කිලෝ ග්‍රෑම් '000) | පහත රට % | ජාතික % |
| අප්‍රේල් 2017 | 1,354 | 2,254 | 75.93 | 5.61 | 3.37 |
| මැයි | 1,174 | 2,130 | 66.30 | 5.65 | 3.11 |
| ජූනි | 1,010 | 1,680 | 59.07 | 5.85 | 3.52 |
| ජූලි | 1,018 | 1,852 | 42.39 | 4.16 | 2.29 |
| අගෝස්තු | 1,104 | 1,901 | 45.50 | 4.12 | 2.39 |
| සැප්තැම්බර් | 1,041 | 1,835 | 44.79 | 4.30 | 2.44 |
| ඔක්තෝබර් | 1,020 | 1,750 | 53.91 | 5.28 | 3.08 |
| නොවැම්බර් | 923 | 1,741 | 59.62 | 6.46 | 3.42 |
| දෙසැම්බර් | 992 | 1,958 | 61.89 | 6.24 | 3.16 |
| ජනවාරි 2018 | 963 | 1,961 | 69.83 | 7.25 | 3.56 |
| පෙබරවාරි | 816 | 1,779 | 59.16 | 7.25 | 3.33 |
| මාර්තු | 1,147 | 2,178 | 93.30 | 8.13 | 4.28 |
| **එකතුව** | 12,562 | 23,019 | 731.69 | 5.82 | 3.18 |

* කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව

## පහතරට සම්ප්‍රදායික නිෂ්පාදනය සහ ජාතික සම්ප්‍රදායික නිෂ්පාදනය සඳහා දායකත්වය

| මාසය | සම්ප්‍රදායික නිෂ්පාදනය | | | නිෂ්පාදනය | | නිෂ්පාදනය සඳහා දායකත්වය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | පහතරට (කිලෝ ග්‍රෑම් '000) | පහතරට (කිලෝ ග්‍රෑම් '000) | ජාතික (කිලෝ ග්‍රෑම් '000) | දැ.තේ.ක*/ හි.හි.ක** (කිලෝ ග්‍රෑම් '000) | මැ.තේ.ක*** (කිලෝ ග්‍රෑම් '000) | පහත රට % | මධ්‍ය % | ජාතික % |
| අප්‍රේල් 2017 | 17,842 | 4,490 | 30,228 | 43.6 | 28.1 | 0.24 | 0.63 | 0.24 |
| මැයි | 15,750 | 4,215 | 27,020 | 36.3 | 21.2 | 0.23 | 0.50 | 0.21 |
| ජූනි | 17,076 | 3,328 | 25,146 | 28.6 | 20.6 | 0.17 | 0.62 | 0.20 |
| ජූලි | 16,026 | 3,019 | 23,553 | 19.1 | 18.3 | 0.12 | 0.60 | 0.16 |
| අගෝස්තු | 16,072 | 2,703 | 22,571 | 20.4 | 16.1 | 0.13 | 0.60 | 0.16 |
| සැප්තැම්බර් | 16,087 | 2,964 | 23,426 | 20.3 | 15.7 | 0.13 | 0.53 | 0.15 |
| ඔක්තෝබර් | 15,680 | 2,750 | 23,010 | 18.8 | 17.5 | 0.12 | 0.64 | 0.16 |
| නොවැම්බර් | 14,660 | 2,926 | 22,868 | 18.5 | 14.5 | 0.13 | 0.50 | 0.14 |
| දෙසැම්බර් | 14,660 | 2,605 | 21,433 | 18.9 | 15.2 | 0.13 | 0.58 | 0.16 |
| ජනවාරි 2018 | 14,985 | 2,482 | 22,146 | 20.7 | 18.1 | 0.14 | 0.73 | 0.18 |
| පෙබරවාරි | 12,103 | 2,390 | 19,125 | 18.4 | 11.1 | 0.15 | 0.46 | 0.15 |
| මාර්තු | 17,033 | 3,217 | 26,024 | 26.0 | 13.6 | 0.15 | 0.42 | 0.15 |
| **එකතුව** | 187,974 | 37,089 | 286,550 | 289.6 | 210.1 | 0.15 | 0.57 | 0.17 |

* දැරංගල තේ කර්මාන්තශාලාව

** හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව

*** මැණික්දිවෙලතේ කර්මාන්තශාලාව

## සමාගම අනුව පහතරට තේ නිෂ්පාදනය සහ ජාතික තේ නිෂ්පාදනය සඳහා දායකත්වය

| මාසය | සමස්ත නිෂ්පාදනය | | | නිෂ්පාදන සමාගම | නිෂ්පාදනය සඳහා දායකත්වය | | |
|---|---|---|---|---|---|---|---|
| | පහතරට (කිලෝ ග්‍රෑම් '000) | මධ්‍ය (කිලෝ ග්‍රෑම් '000) | ජාතික (කිලෝ ග්‍රෑම් '000) | (කිලෝ ග්‍රෑම් '000) | පහතරට % | මධ්‍ය % | ජාතික % |
| අප්‍රේල් 2017 | 19,196 | 4,490 | 32,482 | 147.6 | 0.77 | 0.63 | 0.45 |
| මැයි | 16,924 | 4,215 | 29,150 | 123.8 | 0.73 | 0.50 | 0.42 |
| ජූනි | 18,086 | 3,328 | 26,826 | 108.3 | 0.60 | 0.62 | 0.40 |
| ජූලි | 17,044 | 3,019 | 25,405 | 79.8 | 0.47 | 0.60 | 0.31 |
| අගෝස්තු | 17,176 | 2,703 | 24,472 | 82.0 | 0.48 | 0.60 | 0.34 |
| සැප්තැම්බර් | 17,128 | 2,964 | 25,261 | 80.9 | 0.47 | 0.53 | 0.32 |
| ඔක්තෝබර් | 16,700 | 2,750 | 24,760 | 90.2 | 0.54 | 0.64 | 0.36 |
| නොවැම්බර් | 15,583 | 2,926 | 24,609 | 92.7 | 0.59 | 0.50 | 0.38 |
| දෙසැම්බර් | 15,652 | 2,605 | 23,391 | 96.0 | 0.61 | 0.58 | 0.41 |
| ජනවාරි 2018 | 15,948 | 2,482 | 24,107 | 108.6 | 0.68 | 0.73 | 0.45 |
| පෙබරවාරි | 12,919 | 2,390 | 20,904 | 88.7 | 0.69 | 0.46 | 0.42 |
| මාර්තු | 18,180 | 3,217 | 28,202 | 132.9 | 0.73 | 0.42 | 0.47 |
| **එකතුව** | 200,536 | 37,089 | 309,569 | 1,231.4 | 0.61 | 0.57 | 0.40 |

# විකුණුම් සාමාන්‍යය උන්නතාංශ සමග සැසඳුම

## පහතරට උන්නතාංශ සාමාන්‍යය සමග සැසඳුම

| මාසය | පහතරට සාමාන්‍යය රු. | මාසික සාමාන්‍යය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | කළුබෝවිටියාන රු. | විචලනය | දෑරංගල රු.ශ | විචලනය | හිනිදුම රු. | විචලනය |
| අප්‍රේල් 2017 | 663.49 | 671.13 | 7.64 | 660.80 | (2.69) | 671.92 | 8.43 |
| මැයි | 669.08 | 586.21 | (82.87) | 661.64 | (7.44) | 688.54 | 19.46 |
| ජූනි | 644.29 | 599.96 | (44.33) | 639.60 | (4.69) | 671.27 | 26.98 |
| ජූලි | 618.61 | 641.00 | 22.39 | 596.32 | (22.29) | 635.55 | 16.94 |
| අගෝස්තු | 628.48 | 703.49 | 75.01 | 624.84 | (3.64) | 642.25 | 13.77 |
| සැප්තැම්බර් | 654.23 | 768.65 | 114.42 | 692.90 | 38.67 | 647.85 | (6.38) |
| ඔක්තෝබර් | 661.00 | 846.00 | 185.00 | 715.38 | 54.38 | 685.80 | 24.80 |
| නොවැම්බර් | 636.58 | 848.63 | 212.05 | 681.09 | 44.51 | 612.11 | (24.47) |
| දෙසැම්බර් | 631.29 | 772.40 | 141.11 | 480.87 | (150.42) | 484.21 | (147.08) |
| ජනවාරි 2018 | 657.01 | 768.92 | 111.91 | 681.75 | 24.74 | 689.06 | 32.05 |
| පෙබරවාරි | 640.84 | 805.31 | 164.47 | 674.47 | 33.63 | 644.93 | 4.09 |
| මාර්තු | 629.56 | 798.62 | 169.06 | 656.95 | 27.39 | 644.60 | 15.04 |

**කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව - උන්නතාංශය සමග සැසඳීම** (රු.)




**දෑරංගල තේ කර්මාන්තශාලාව** - උන්නතාංශය සමග සැසඳීම (රු.)




**හිනිදුම හිල්ස් තේ කර්මාන්තශාලාව** - උන්නතාංශය සමග සැසඳීම (රු.)



## මැදි වගා උන්නතාංශ සාමාන්‍යය සමග සැසඳුම

| මාසය | මැදි වගා සාමාන්‍යය රු. | මාසික සාමාන්‍යය | |
|---|---|---|---|
| | | මැණික්දිවෙල රු. | විචලනය |
| අප්‍රේල් 2017 | 619.45 | 617.96 | (1.49) |
| මැයි | 601.75 | 620.37 | 18.62 |
| ජූනි | 540.15 | 558.88 | 18.73 |
| ජූලි | 519.25 | 503.63 | (15.62) |
| අගෝස්තු | 523.95 | 522.51 | (1.44) |
| සැප්තැම්බර් | 563.18 | 572.55 | 9.37 |
| ඔක්තෝබර් | 574.80 | 592.49 | 17.69 |
| නොවැම්බර් | 562.60 | 587.89 | 25.29 |
| දෙසැම්බර් | 548.79 | 567.89 | 19.10 |
| ජනවාරි 2018 | 578.95 | 599.83 | 20.88 |
| පෙබරවාරි | 579.74 | 604.32 | 24.58 |
| මාර්තු | 570.07 | 562.52 | (7.55) |

**මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව** - උන්නතාංශය සමග සැසඳීම (රු.)



# ඉහළම මිල ගණන් – 2017/18

| දිනය | ශ්‍රේණිය | | | | | තැරැව්කරු |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | කළුබෝවිටියාන | | | | දැරංගල | |
| | BP1 (රු.) | PF1 (රු.) | P. DUST (රු.) | PFGS (රු.) | OP (රු.) | |
| 2017 මැයි 31 | | | 620.00 | | | F & W |
| 2017 ජූලි 5 | | | 650.00 | | | CTB |
| 2017 ජූලි 12 | | | 670.00 | | | Asia Siyaka |
| 2017 ජූලි 19 | | | 660.00 | | | Asia Siyaka |
| 2017 ජූලි 25 | | | 670.00 | | | F & W |
| 2017 අගෝස්තු 2 | | | 680.00 | | | F & W |
| 2017 අගෝස්තු 16 | | | 780.00 | | | John Keels |
| 2017 සැප්තැම්බර් 6 | | 775.00 | | | | LCBL/Bartleet |
| 2017 සැප්තැම්බර් 13 | | | 720.00 | | | John Keels |
| 2017 ඔක්තෝබර් 3 | | 860.00 | | | | Bartleet |
| 2017 ඔක්තෝබර් 17 | | 880.00 | | | | John Keels |
| 2017 ඔක්තෝබර්17 | | 880.00 | | | | Asia Siyaka |
| 2017 ඔක්තෝබර්17 | | 880.00 | | | | LCBL |
| 2017 ඔක්තෝබර්17 | | 880.00 | | | | Bartleet |
| 2017 ඔක්තෝබර්25 | | 880.00 | | | | John Keels |
| 2017 ඔක්තෝබර්25 | | 880.00 | | | | F & W |
| 2017 ඔක්තෝබර්25 | | 880.00 | | | | LCBL |
| 2017 ඔක්තෝබර්25 | | 880.00 | | | | Bartleet |
| 2017 ඔක්තෝබර්25 | | 880.00 | | | | Asia Siyaka |
| 2017 නොවැම්බර් 1 | | 890.00 | | | | John Keels |
| 2017 නොවැම්බර් 15 | | | 770.00 | | | John Keels |
| 2017 දෙසැම්බර් 13 | | | 775.00 | | | Bartleet |
| 2018 පෙබරවාරි 28 | | 870.00 | | | | F & W |

ASIA : ආසියා සියාකා කොමොඩිටීස් (පුද්) සමාගම.
FW : ෆෝබ්ස් සහ වෝකර්ස් ටී බ්‍රෝකර්ස් (පුද්) සමාගම
LCBL : ලංකා කොමෝඩිටි බ්‍රෝකර්ස්
MBSL : මර්කන්ටයිල් ප්‍රොඩියුස් බ්‍රෝකර්ස්
CTB : සිලෝන් ටී බ්‍රෝකර්ස්

## සීආර්ටී ප්‍රදර්ශනය

අවුරුදු 150 ක සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියන ලංකා තේ සිය අනන්‍යතාව සහ වෙළඳ නාමය ලෝක සිතියමේ නොමැකෙන ලෙස සටහන් කර තිබේ. ජාත්‍යන්තර තේ වෙළඳ පොළේ සිය නාමය සනිටුහන් කළ කළුබෝවිටියාන තේ 2018 අගෝස්තු 11 වන දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති උත්සවයකදී දේශීය වෙළඳපොළ වෙත සිය තේ හඳුන්වාදුන් අතර එහිදී ප්‍රථම පැකට්ටුව අතිගරු ජනාධිපතිතුමන් වෙත පිරිනමන ලදී.

මලු, සැෂේ පැකට්ටු, කුඩා පෙට්ටි සහ ලී පෙට්ටිවල අසුරන ලද තේ නිෂ්පාදන මාලාවක් දේශීය පාරිභෝගියන් වෙත පිරිනමන අතර ඒවායේ සුවිශේෂී රස හා සුවඳ හේතුවෙන් පාරිභෝගිකයන් අතර බෙහෙවින් ජනප්‍රිය වී තිබේ.

## සම්මාන සහ ගෞරව

- 2017 මැයි මාසයේ චීනයේ පවත්වන ලද ලංකා විශේෂ වතු තේ තරඟයේදී සීටීසී කාණ්ඩය සඳහා කළුබෝවිටියාන තේ සමාගම රන් පදක්කම දිනාගන්නා ලදී.
- 2017 ජූලි මාසයේදී ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මධ්‍ය පරිමාණ කාණ්ඩයේ හොඳම තේ කර්මාන්තශාලාව ලෙස කළුබෝවිටියාන සීටීසී තේ කර්මාන්තශාලාවට සම්මාන පිරිනමන ලදී.








නවතම තේ පැකට්ටුව හඳුන්වා දීම




හොඳම තේ කර්මාන්තශාලාව (කලාපීය මට්ටම 2017 – 2 වන ස්ථානය - මධ්‍ය පරිමාණ කාණ්ඩය) – ශ්‍රී ලංකා තේ මණ්ඩලය




2017 වසරේ හොඳම ලංකා විශේෂ වතු තේ
(කුසලතා සම්මානය – PF1 – සීටීසී කලාපය) – චීනය

# මූල්‍ය සමාලෝචනය

## ආදායම් විශ්ලේෂණය

ඉකුත් මූල්‍ය වසරේ ඉපැයූ රු. මිලියන 936ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සමාගම වාර්තා කළ දළ ආදායම රු. මිලියන 1,004 ක් වූ අතර එය පෙර වසර හා සැසඳීමේදී 7.26%ක වැඩිවීමක් පෙන්නුම් කරයි. ඵලදා නිමැවුම සඳහා බලපෑ අහිතකර කාලගුණය, රුසියාවේ ඇතැම් ගැනුම්කරුවන් කෙන්යාවෙන් සීටීසී තේ මිලට කැනීම සඳහා යොමුවීම සහ තම තේ හැකිතාක් දුරට කුඩා තේ වතු අංශයෙන් ලබාගැනීම සඳහා තේ කර්මාන්තශාලා අතර පැවැති දැඩි තරඟකාරිත්වය පෙර වසරේ මෙන්ම මේ වසරේදී ද පැවැති ප්‍රධාන අභියෝග විය. ආදායම් සංරචකය ගත්කළ, රු. මිලියන 76.16කින් සමන්විත වූ දේශීය අලෙවිය පෙර වසරට සාපේක්ෂව 56%ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. රජයේ ආයතන සහ සුබසාධක සංගම් වැඩි වශයෙන් අපගේ තේ මිලයට ගැනීම මේ සඳහා හේතු කාරක විය.

## විකුණුම් පිරිවැය හා මෙහෙයුම් වියදම්

රු. මිලියන 983ක් වූ විකුණුම් පිරිවැය පෙර මූල්‍ය වසරට සාපේක්ෂව 11.3% ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. සෑම වසරකම එක හා සමාන තේ ප්‍රමාණයක් නිෂ්පාදනය කළ ද දළු පිරිවැයට අදාළව තම නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීමට සමාගම සමත් විය.

බහුවිධ වියදම් සංරචකයන්ගේ ඉහළයාමට අනුකූලව පරිපාලන වියදම් ඉකුත් වසරේ රු. මිලියන 32.5ට සාපේක්ෂව රු. මිලියන 39.21 දක්වා දක්වා වැඩි විය. කාර්ය මණ්ඩල වැටුප් ප්‍රමාණ වැඩිවීමට අනුව පිරිස් පිරිවැය ඉහළ යන ලදී.

## වෙනත් මෙහෙයුම් ආදායම

අනෙකුත් මෙහෙයුම් ආදායම, ඉකුත් මූල්‍ය වසරේ වාර්තා වූ රු. මිලියන 8.2 සිට රු. මිලියන 16.51 දක්වා වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස මෙහෙයුම් ලාභය ඉකුත් වසරේ වාර්තා වූ රු. මිලියන 28.2 සිට රු. මිලියන 3.2 දක්වා අඩු වුණි.

## මූල්‍ය පිරිවැය

වර්ෂය තුලදී සමාගමේ මූල්‍ය වියදම් රු. මිලියන 13.2 ක් වුණි. ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළදී සමාගම රු. මිලියන 9.5 ක පොළී ආදායමක් උපයන ලදී. 2003 වසරේදී බීසීසී ලංකා ආයතනය වෙත සමාගම ලබාදුන් ණය ශේෂ පත්‍රයේ දිගටම පැවැති අතර එමගින් සමාගමට පොළී ආදායමක් උත්පාදනය වුණි.

බදු ගෙවීමෙන් පසුව, 2016/17 න් අවසන් මුදල් වර්ෂයේ රු. මිලියන 30.9 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව මේ වසරේ ශුද්ධ ලාභය රු. මිලියන 6.9 දක්වා 126% ක අඩුවීමක් සමාගම වාර්තා කරන ලදී.

## මූල්‍ය තත්වය හා ද්‍රවශීලතාව

### ජංගම නොවන වත්කම්

ජංගම නොවන වත්කම්, මුළු වත්කම් පදනමින් 35.8%කින් සමන්විත විය. සමාලෝචිත මුදල් වර්ෂය තුළදී මැණික්දිවෙල තේ කර්මාන්තශාලාව සංවර්ධනය කිරීම පිණිස සමාගම මුදල් ආයෝජනය කරන ලදී.

### ණය - බීසීසී ලංකා සමාගම

2004 වසරේදී බීසීසී ලංකා සමාගම වෙත ලබාදෙන ලද රු. මිලියන 10 ක ණය මුදල හා ඒ සඳහා සමුච්චිත පොළිය වන රු. මිලියන 40.17 (මුළු මුදල රු. මිලියන 50.17) ආපසු අයකර ගැනීම සඳහා සමාගම ප්‍රයත්න කිහිපයක් දැරුවද ඒ කිසිවක් සාර්ථක නොවීය.

### කාරක ප්‍රාග්ධනය

ශේෂ පත්‍ර දිනයට තොග භාණ්ඩවල වෙළඳපොළ වටිනාකම පොදුවේ වැඩිවීම හේතුවෙන් වර්ෂය තුළ දී සමාගමේ ජංගම වත්කම් පෙර වසරේ පැවැති රු. මිලියන 407.89 සිට රු. මිලියන 439.02 දක්වා සැළකිය යුතු ලෙස ඉහළ නැංවුණි. රු. මිලියන 27.95 ක් වූ වෙළඳ ණයගැති සංරචකය රු. මිලියන 24.9 දක්වා අඩු වුණි. "වෙළඳ ගෙවිය යුතු දෑ" ප්‍රමාණය පෙර වසරවල පැවැති රු. මිලියන 89.28 සිට රු. මිලියන 100.82 දක්වා දක්වා ඉහළ යන ලදී. එබැවින් සමාගම සිය කාරක ප්‍රාග්ධන චක්‍රය සතුටුදායක සීමාවන් තුල කළමනාකරණය කරගන්නා ලදී.

## ප්‍රාග්ධන ව්‍යුහය

### සාමාන්‍ය කොටස් ප්‍රමාණය

සමාගම රු. 46,375,070.00ක වටිනාකමක් සහිත සාමාන්‍ය ප්‍රාග්ධන කොටස් නිකුත් කරන ලදී. ඉදිරියට රැගෙන ආ ලාභ මගින් සමාලෝචිත මුදල් වර්ෂය සඳහා රඳවාගත් ඉපැයුම් හා සංචිත ප්‍රවර්ධනය කරනු ලැබූ අතර එමගින් ප්‍රවර්තන මුදල් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් රු. මිලියන 454 දක්වා 1.7%කින් ඉහළ නැංවුණි.

### ණය ගැනීම්

සමාගම රු. මිලියන 55ක් වූ කාරක ප්‍රාග්ධනය ණයක් මහජන බැංකුවෙන් ලබාගත් අතර ඒ සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2%ක පොළී සහනාධාරයක් ලබා දෙන ලදී.මෙය සමාගමේ බැංකු අයිරා පොළී ගෙවීම් ප්‍රමාණය අඩු කිරීමට හේතු විය.

## පුහුණුව සහ සංවර්ධනය

මානව ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා වන අපගේ ප්‍රයත්නයේ පදනම වනුයේ පුහුණුව හා සංවර්ධනයයි. කළමනාකාරිත්වය අඛණ්ඩව කුසලතා ඌනතා අගයා, නිත්‍ය කාල අන්තර තුළ කාර්ය මණ්ඩලයේ කුසලතා වර්ධනය සහතික කිරීම පිණිස කුසලතා ඇගයීමේ ප්‍රතිඵල අනුව පුහුණු සහ සංවර්ධන කටයුතු සිදු කරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේදී, කාර්ය මණ්ඩලයේ වෘත්තීමය සහ තාක්ෂණික කුසලතා ප්‍රවර්ධනය පිණිස සමාගම සිය සේවකයන් සඳහා විවිධ පුහුණු අවස්ථා පිරිනමන ලදී.

අපගේ සේවකයන්ගේ පුහුණුව සහ සංවර්ධනය සඳහා අනුගමනය කළ එක් වැදගත්ම ක්‍රමවේදයක් වනුයේ කාර්යස්ථ පුහුණුවයි. තවද, සමාගමේ බහුවිධ අංශයන්හි කටයුතු කිරීමට හැකිවන පරිදි අප කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීම පිණිස ඔවුන්ට තීර්යක් පුහුණුව ලබා දෙන ලදී. එවැනි හැකියා වර්ධන ක්‍රියා පටිපාටි සමාගමේ නම්‍යතාවය ඉහළ නංවා ඇති අතර කුසලතා උපයෝජනයෙන් සහ උපරිමායනයෙන් වාසි සලසා ගැනීමට හැකියාව ඇතිකර තිබේ. අපගේ සේවකයන්ට සමාගම හරහා සංචලතාව සඳහා අවස්ථා කිහිපයක් ලබා දී ඇති අතර වෘත්තීය සංවර්ධන ඉඩප්‍රස්තා සඳහා ප්‍රමුඛතාව ලබා දී තිබේ.

වසර තුළ විධායක නිලධාරීන්/කාර්ය මණ්ඩලය සහ සේවකයන් සඳහා පුහුණු වැඩසටහන්:

- තිරසර භාවිතාවන් අනුගත වීම පිණිස කාර්ය මණ්ඩලය සඳහා වැවිලි ගිණුම්කරණ පාඨමාලාව (ජාතික වැවිලි කළමණාකරණය පිළිබඳ ආයතනය)
- ව්‍යාප්ති නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන (ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය - රත්නපුර)
- තේ කර්මාන්තයේදී අවශ්‍ය කරනු ලබන පද්ධති සහ ක්‍රියාදාමයන් සඳහා සේවකයන් සම්බන්ධවීම ඉහළ නැංවීම පිණිස කුසලතා සංවර්ධන සහ අභිප්‍රේරණ වැඩසටහන (ජාතික වැවිලි කළමණාකරණය පිළිබඳ ආයතනය)
- කර්මාන්තශාලා කළමනාකරුවන් සඳහා සාප්පු සහ කාර්යාල නීතිය පිළිබඳ පුහුණු වැඩසටහන (McQuireRens) Jones (Pvt) Ltd.
- ගබඩා භාරකරුවන් සඳහා මූලික ගබඩා කළමනාකරණ පාඨමාලාව (ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය)



පුහුණු වැඩසටහනක්

## ප්‍රාග්ධන ආයෝජන

තම තරඟකාරිත්වය පවත්වා ගැනීම පිණිස පද්ධති, ක්‍රියාදාම සහ යටිතල පහසුකම්වල ධාරිතා ඉහළ නැංවීම සමාගම කලින් කලට සිදුකරයි. සමාලෝචිත වර්ෂයේදී ඒ සම්බන්ධයෙන් ව්‍යාපෘති කිහිපයක් සිදු කළ අතර ඒවා පහත දැක්වේ.

- කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවේ දොරු ඒකක අළුත්වැඩියා සහ නවීකරණය කිරීම, CFU කැපීම් කොටස් 02ක් සපයා සවිකිරීම, සිසිලන පද්ධති 02ක් සපයා සවිකිරීම සහ මල නොබඳින වානේ රොටවේන් සපයා සවිකිරීම සඳහා සිය සැලසුම් සමාගම ඉදිරියට පවත්වා ගෙන යන ලදී.
- ගිණුම්කරණ පද්ධති ඒකාබද්ධ කිරීම පිණිස කර්මාන්තශාලා හතරෙහිම සහ ප්‍රධාන කාර්යාලයේ තොරතුරු තාක්ෂණ විසඳුමක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර එහි කටයුතු සිදුකරමින් පවතී.
- වර්ෂය තුළදී රු. මිලියන 3.7ක් වැයකර සියලු කර්මාන්තශාලාවල සීසීටීවී අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කළ අතර කර්මාන්තශාලා වඩා හොඳින් අධීක්ෂණය සඳහා ඒවා ප්‍රධාන කාර්යාලය වෙතද සම්බන්ධ කර තිබේ.
- කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාවේ ආරක්ෂාව සහතික කිරීම පිණිස රු. මිලියන 6.8 ක් වැය කර ඒ වටා ආරක්ෂිත වැටක් ඉදිකරන ලදී.
- නිෂ්පාදන ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම පිණිස හිනිදුම සහ මැණික්දිවෙල කර්මාන්තශාලා සඳහා රු. මිලියන 25 ක වැය කොට අළුත්ම වර්ණ තේරීම් යන්ත්‍ර දෙකක් සවිකරන ලදී.
- දෑරංගල කර්මාන්තශාලාවේ වියලනය රු. මිලියන 0.6 ක් වැය කොට වැඩි දියුණු කරන ලදී.
- කාර්ය මණ්ඩලයේ/සේවකයන්ගේ දිනපතා පැමිණීම සටහන් කරනු පිණිස සියලු කර්මාන්තශාලාවල මුහුණ අභික්ෂණ ඒකක සවිකරන ලදී.



හිනිදුම කර්මාන්තශාලාවේ වර්ණ විභේදන යන්ත්‍රයක් ස්ථාපනය කරන ලදී.



මැණික්දිවෙල කර්මාන්තශාලාවේ වර්ණ විභේදන යන්ත්‍රයක් ස්ථාපනය කරන ලදී.

# සමාජ ප්‍රාග්ධනය

කුඩා තේ වතු හිමියන්, කාර්ය මණ්ඩලය සහ සේවකයන් තම ප්‍රධානතම පාර්ශවකරුවන් ලෙස සමාගම සලකන අතර එම වටිනා පාර්ශවකරුවන් සමග සමීපව දිගටම කටයුතු කරන බවට සහතික වෙයි. තම පාර්ශවකරුවන් සමග දැඩි සමීපතාවකින් කටයුතු කිරීමෙන් අදහස් වනුයේ ඔවුන් මුහුණ දෙන අභියෝග සමාගම අවබෝධ කරගන්නා බවත් පාර්ශවකරුවන්ගේ ප්‍රතිලාභය සහ ඔවුන් නගා සිටුවීම සඳහා ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති ගණනාවක් පවත්වා ඇති බවත්ය.

## සෞඛ්‍යාරක්ෂණය

සමාගමේ පාර්ශවකරුවන්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම අවධානය යොමු කරන මූලික කරුණක් වන අතර සෑම වසරකම ඔවුන්ගේ ප්‍රතිලාභය සඳහා ව්‍යාපෘති කිහිපයක් ඉටු කරනු ලැබේ. ඒවා පහත පරිදිය:

- කුඩා තේ වතු හිමියන්, කාර්ය මණ්ඩලය සහ සේවකයන්ගේ ජිවන තත්වය යහපත් කිරීම සඳහා වෛද්‍යා සායන පැවැත්වීම සහ සඳහා ඇස් කණ්නාඩි සැපයීම.
- කුඩා තේ වතු හිමියන්, කාර්ය මණ්ඩලය සහ සේවකයන් සහභාගිත්වයෙන් සමාගම ලේ දන්දීමේ ව්‍යාපාරයක් පැවැත්වීය. සුහදශිලිත්වය සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කරනු පිණිස, සමාගම සමාගම කුඩා තේ වතු හිමියන්ගේ සියලු සමාජීය ක්‍රියාකාරකම් සඳහා සහයෝගය දක්වයි.
- වතු සේවකයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ගුණාත්මක සේඛ්‍ය සේවා සැපයීම පිණිස හදිසි අවස්ථා සෞඛ්‍ය සේවා, මාතෘ සායන, ඊ.සී.ජී. සහ රුධිර සීනි මට්ටම පරීක්ෂා කිරීම ඇතුලත් සමාගම සෞඛ්‍ය මධ්‍යස්ථානයක් පවත්වනු ලැබීය.

## අධ්‍යාපනික සහ ආගමික ව්‍යාපෘති සහ අනෙකුත් ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

- දැනුම පාදක සමාගමක් ලෙස, අවවරප්‍රසාදිත සිසුන්ට මූල්‍ය දුෂ්කරතා සම්බන්ධයෙන් සිත් තැවුලට පත් නොවී තම අධ්‍යාපනික කටයුතු පවත්වා ගැනීම සඳහා සහාය වීමට හැකිවීම සමාග මට ආඩම්බරයට කරුණකි. තේ වගා කරන පවුල් සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ගේ ළමුන් වෙත මෙම වර්ෂය තුළදී අපි ශිෂ්‍යත්ව පිරි නැමූ අතර පාසල් වෙත මූල්‍ය අනුග්‍රහය දැක්වූයෙමු.
- අපගේ සියලු පාර්ශවකරුවන්ගේ සුබසාධනය සඳහා තත්ත්ව ප්‍රමිති වැඩි දියුණු කිරීම පිණිස රන්දළු සුබසාධක සමිතිය පිහිටුවනු ලැබීය.
- කුඩා තේ වතු හිමියන් සඳහා තේ වගාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.
- අප ජනතාවගේ ආගමික නැඹුරුව සිත්හි ධාරණය කර ගනිමින්, ආගම තම පාර්ශවකරුවන්ගේ ජීවිතවල වැදගත් භූමිකාවක් ඉටුකරන බවට සමාගම අවබෝධයෙන් සිටින බැවින්, කාර්ය මණ්ඩලය සහ සේවකයන් සඳහා එය වන්දනා ගමන් සංවිධානය කිරීම මගින් ඒ සඳහා පහසුකම් සපයයි. සමාලෝචිත වර්ෂයේදී, දානමය පිංකමක් සමග සිල් ව්‍යාපාරයක් සංවිධානය කරන ලදී. තවද, ශ්‍රමදාන වැඩසටහනක් ද පවත්වන ලදී.
- තේ වගාව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය කුඩා තේ වතු හිමියන් වෙත සපයන ලදී.
- කුඩා තේ වතු හිමියන් සඳහා සහනදායී ණය පහසුකම් සපයන ලදී.





පිරිත් පිංකම 2017/18





පාසල් ළමුන් සඳහා ලිපිද්‍රව්‍ය ලාබාදීම

## සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

### ව්‍යාපාරයේ ස්වභාවය

සමාගම ප්‍රධාන ව්‍යාපාරික කටයුතු වනුයේ වගාකරුවන්ගෙන් මිලදී ගත් තේ දළු පිරියම් කිරීමේ, කල් තබා ගත හැකි ලෙස සකස් කිරීමේ, පිළියෙල කිරීමේ, පිරිසැකසුම් කිරීමේ සහ අලෙවි කිරීමේ නිරත වීම සහ තේ වගා කිරීම, සිටුවීම සහ තේ වතු කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම වේ.

### සමාගමේ කාර්යසාධනය

වාර්ෂික වාර්තාවේ කොටසක් සම්පාදනය කරන්නා වූ විගණන වාර්තාව ද ඇතුළුව (මීට අමුණා ඇති) මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ අදහස් දැක්වීම් සහිතව වර්ෂය තුළ සමාගමේ කටයුතු සහ එහි කාර්යසාධනය පිළිබඳ සමාලෝචනය මූල්‍ය ප්‍රකාශනයන්හි අන්තර්ගත වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී අනුගමනය කරන ලදගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 42 සිට 46 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා වූ සටහන්වල දක්වා තිබේ.

### ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම්

සමාගම විසින් කලින් වසරේඅනුගමනය කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වල කිසිදු වෙනසක් නොමැතිව සංගතව ආදේශ කර තිබේ.

### පොළී ලේඛනයේ ඇතුළත් කළ සටහන්

පොළී ලේඛනයේ ඇතුළත් කළ සටහන් 58 සහ 59 පිටුවල "ආශ්‍රිත පාර්ශව ගනුදෙනු" යන මාතෘකාව යටතේ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල හෙළදරව් කොට ඇත.

### අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකය සහ අනෙකුත් ප්‍රතිලාභ

2018 මාර්තු 31න් අවසන් මූල්‍ය වසර සඳහා අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි 48 වන පිටුවෙහි විස්තර කොට ඇත.

### පරිත්‍යාග

2018 මාර්තු 31න් අවසන් මූල්‍ය වසර සඳහා සමාගමේ මුළු පරිත්‍යාග මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි 30වන පිටුවෙහි පෙන්නුම් කර ඇති පරිදි රු. 676,343.05කි.

### සමාගමේ අධ්‍යක්ෂවරු

2017 මාර්තු 31න් අවසන් මූල්‍ය වසර සඳහා සමාගමේ අධ්‍යක්ෂවරු පහත දැක්වෙන පරිදි වේ.

පී එස් සමරකෝන් මයා - සභාපති
අයි සුගතදාස මිය
එච් එච් කස්තුරිආරච්චි මයා
පී රාසයියා මයා
ටී පී රත්නායක මයා
එම් ඒ එල් එස් එන් කේ මන්ත්‍රීනායක මයා
ඒ යූ සී අතුකෝරාළ මයා
ඩී අඹේවෙල මයා
ජී නල්ලපෙරුම මයා
කේ බ්‍රාහ්මන මයා

### විගණන ගාස්තු

සමාලෝචිත මූල්‍ය වර්ෂය සඳහා විගණන ගාස්තුව ගෙවා නොමැත.

### විගණකවරු ලෙස හැර විගණකවරුන් සමාගම සමග ඇති බැඳියා

තම ස්වාධීන්තවයට හානි වන කිසිදු සබඳතාවක් හෝ බැඳියාවක් විගණකවරුන් සමාගම කෙරෙහි නොමැති බවට අධ්‍යක්ෂවරුන් සෑහීමකට පත්වේ.

අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ

Director
CORPORATE SERVICES (PRIVATE) LIMITED
Secretaries

සමාගමේ ලේකම්

2018 අගෝස්තු 27 වන දින දීය



# මූල්‍ය වාර්තා


| | |
|---|---|
| විගණකාධිපති වාර්තාව | 36 |
| ලාභ/(අලාභ) සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 38 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | 39 |
| ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය | 40 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 41 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති | 42 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 47 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා විස්තරාත්මක උපලේඛන | 60 |
| පූර්ව වසර දහයෙහි විශේෂ මූල්‍ය සිදුවීම් | 66 |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පීඑල්ජී/බී/කේටීඑෆ්/01/17/18/01 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2018 අගෝස්තු 26 දින


**සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ කොටස් හිමියන් වෙත.**

## සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ 2018 මාර්තු 31 දිනට අවසන් වසර සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## තත්වාගණනය කළ මතය

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 වන ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 225,098,331 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර සාධාරණ අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ විලම්භිත බදු වගකීම හා වියදම ගණනය කිරීමේදී අදායම් බදු පනත අනුව යොදාගතයුතු බදු අනුපාතය සියයට 14ක් වුවද එය සියයට 10 ක් ලෙස යොදාගැනීම හේතුවෙන් විලම්භිත බදු වගකීම හා එම වියදම රු. 1,986,552 කින් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි.

(ඇ) 2014/15 වසරේදී රු. 1,000,000 කට විකුණන ලද ක්ෂය කරන ලද තේ වියලුම් යන්ත්‍රයෙහි පිරිවැය හා සමුච්චිත ක්ෂය සමාලෝචිත වර්ෂය අවසනය දක්වාම හඳුනාගෙන ගිණුම්වලට ගැලපීම් කර නොතිබුණි.

(ඈ) බදු පදනම මත ලබාගෙන තිබූ හිනිදූම හිල්ස් තේ කර්මාන්තශාලාවේ තීන්ත ආලේපන හා ගොඩනැගිලි අළුත්වැඩියා සඳහා 2012/2013 වර්ෂයේදී දරන ලද රු. 6,194,940 ක් එම වර්ෂයේදී ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ද එම වරද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් තවදුරටත් සමාලෝචිත වර්ෂයේදී රු. 1,238,988 ක් ලාභයට එරෙහිව ක්ෂය ලෙස කපා හැර තිබුණි.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

(ඉ) ආයුගණක තක්සේරු වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයට අදාලව පාරිතෝෂික වෙන්කිරීම රු. 2.962,416ක් වුවද එම වටිනාකම ගිණුම්ගත කිරීම වෙනුවට මූල්‍ය ප්‍රකාශනවල රු. 1,120,128 ක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂිත වෙන්කිරීම රු. 1,842,288 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2015/2016 වර්ෂයේ මැණික්දිවෙල කර්මාන්තශාලාවට අමු දළු සැපයීම වෙනුවෙන් ගෙවිය යුතු රු. 1,046,771 ක් ගිණුම්ගතකර නොතිබුණු අතර, 2016/17 වර්ෂයේ එම මුදල ගෙවීම් කිරීමේදී රඳවාගත් ලාභයට ගැලපීම වෙනුවට විවිධ ණයගැති ගිණුමට හර කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල රඳවාගත් ලාභය හා විවිධ ණයගැති ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) තේ ශක්ති අරමුදලට 2015 අප්‍රේල් 09 වැනි දින ලබා දී තිබූ රු. 50,000,000ක් වන ණය මුදල මූල්‍ය වත්කම් යටතේ අනාවරණය කර තිබුණ ද එම ශේෂය තහවුරු කිරීමට හා ශේෂ සනාථ කිරීම් ආදී ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ශේෂයේ පැවැත්ම, නිවැරිදිතාවය, සම්පූර්ණත්වය සම්බන්ධයෙන් විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ඌ) 2003 වසරේදී බී.සී.සී. ලංකා සමාගම වෙත ලබාදී තිබූ රු. 10,000,000 ක ණය සහ ඊට අදාල සමුච්චිත පොලිය රු. 40,174,692ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශවල දක්වා තිබූ නමුත් වසර 15 ක සිට එම ණය සහ පොලිය අයවී නොතිබුණි. එහෙත් සමාගම විසින් එම ණය අයවීමේ ශක්‍යතාව සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 හි 58 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිව ප්‍රකාරව මා විසින් පහත කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණවලින් පෙනීයන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වන වගන්තියෙහි දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

## වාර්ෂික වාර්තා සභාගත කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරයේ ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.



**එච් එම් ගාමිණී විජේසිංහ**

විගණකාධිපති

# ලාභ හෝ පාඩු සහ අනෙකුත් විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

| 2018 මාර්තු 31 අවසන් වසර සඳහා<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | සටහන | 2018<br>රු. | 2017<br>යළි ප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| ආදායම | 3 | 1,004,319,623.10 | 935,591,884 |
| විකුණුම් පිරිවැය | 4 | (983,007,160.69) | (882,539,795) |
| **දළ ලාභය** | | 21,312,462.41 | 53,052,089 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 5 | 16,518,674.56 | 8,249,613 |
| **මෙහෙයුම් වියදම් වලට පෙර ලාභය** | | 37,831,136.97 | 61,301,702 |
| පරිපාලන වියදම් | 6 | (39,218,947.27) | (32,446,062) |
| විකුණුම් සහ බෙදාහැරීම් වියදම් | 7 | (1,897,947.19) | (816,517) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලාභ | | (3,285,757.49) | 28,039,123 |
| මූල්‍ය ආදායම් | 8.1 | 9,572,625.97 | 12,118,517 |
| මූල්‍ය වියදම් | 8.2 | (13,219,529.74) | (9,164,034) |
| ශුද්ධ මූල්‍ය ආදායම | | (3,646,903.77) | 2,954,483 |
| **බදුකරණයට පෙර ශුද්ධ ලාභය** | | (6,932,661.26) | 30,993,606 |
| බදුකරණය | 9 | (654,697.98) | (1,723,391) |
| **බදු අයකිරීමෙන් පසු ශුද්ධ ලාභය** | | (7,587,359.24) | 29,270,215 |
| කොටසක් සඳහා ඉපැයුම් | 10.1 | (1.64) | 6.31 |
| කොටසක් සඳහා ලාභාංශ | 10.2 | – | |
| බදුවලින් පසු ශුද්ධ ලාභය | | (7,587,359.24) | 29,270,215 |
| විශ්‍රාම ප්‍රතිලාභ මත ආයුගණය (ලාභ/අලාභ) | | (921,123.00) | 691,773.52 |
| **වසර සඳහා මුළු විස්තීරණ ආදායම** | | (8,508,482.24) | 29,961,988 |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

| 2018 මාර්තු 31 අවසන් වසර සඳහා<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | සටහන | 2018<br>රු. | 2017<br>යළි ප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත සහ උපකරණ | 11 | **241,766,511.01** | 221,154,765 |
| ජීව විද්‍යාත්මක වත්කම් | 12 | **3,135,037.27** | 3,083,459 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **244,901,548.28** | 224,238,224 |
| **ජංගම වත්කම්** | | | |
| වට්ටෝරු භාණ්ඩ | 13 | **154,600,711.52** | 133,380,209 |
| බීසීසී ලංකා සමාගමෙන් අයවිය යුතු ණය | | **50,174,692.21** | 47,438,780 |
| කෙටි කාලීන ආයෝජන | 14 | **173,965,133.75** | 165,849,053 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 15 | **45,732,815.72** | 54,963,358 |
| ලැබිය යුතු ආදායම් බදු | 25 | **9,429,375.71** | 1,384,543 |
| මුදල් සහ මුදලට සමාන දේ | 16 | **5,118,878.50** | 4,874,961 |
| මුළු ජංගම නොවන වත්කම් | | **439,021,607.41** | 407,890,904 |
| **මුළු වත්කම්** | | **683,923,155.70** | 632,129,127 |
| **ස්කන්ධ හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 17 | **46,375,070.00** | 46,375,070 |
| සංචිත | 18 | **407,676,021.16** | 416,184,503 |
| **මුළු ස්කන්ධ** | | **454,051,091.16** | 462,559,573 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 19 | **13,360,083.00** | 12,971,188 |
| ණය සහ ණය ගැනුම් | 20 | **32,918,166.84** | 30,937,500 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **46,278,249.84** | 43,908,688 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ | 21 | **100,834,667.60** | 89,283,786 |
| බැංකු අයිරා | 22 | **59,952,624.05** | 17,535,366 |
| ණය සහ ණය ගැනුම් | 23 | **18,341,599.92** | 13,750,000 |
| විලම්බිත බදු වගකීම් | 24 | **4,464,923.13** | 5,091,714 |
| **මුළු ජංගම වගකීම්** | | **183,593,814.70** | 125,660,866 |
| **මුළු ස්කන්ධ හා වගකීම්** | | **683,923,155.70** | 632,129,128 |

මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇත්තේ 2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතා ප්‍රකාරව බව අපි සහතික කරමු.

වැඩබලන මූල්‍ය කළමණාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සහ ඉදිරිපත්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවයුතු වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලද්දේ

සභාපති

අධ්‍යක්ෂ

2018 මැයි 28
කොළඹදීය

# ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

| 2018 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | ප්‍රාග්ධනය රු. | භාණ්ඩාගාරය රු. | රඳවාගත් සංචිත රු. | රඳවාගත් ලාභය රු. | එකතුව රු. |
|---|---|---|---|---|---|
| **2016 අප්‍රේල් 01 දිනට ශේෂය** | 46,375,070.00 | – | 600,000.00 | 388,851,196.22 | 435,826,266.22 |
| වසර සඳහා ශුද්ධ ලාභය | – | – | – | 29,270,214.92 | 29,270,214.92 |
| අනෙකුත් විස්තීරණ ආදායම - යළි ප්‍රකාශිත | | | | (691,773.52) | (691,773.52) |
| ක්ෂයවීම- යළි ප්‍රකාශිත | | | | (1,845,134.22) | (1,845,134.22) |
| **2017 අප්‍රේල් 01 දිනට ශේෂය - යළි ප්‍රකාශිත** | 46,375,070.00 | – | 600,000.00 | 415,584,503.40 | 462,559,573.40 |
| වසර සඳහා ශුද්ධ ලාභය | – | – | – | (7,587,359.24) | (7,587,359.24) |
| අනෙකුත් විස්තීරණ ආදායම | | | | (921,123.00) | (921,123.00) |
| **2018 මාර්තු 31 දිනට ශේෂය** | 46,375,070.00 | – | 600,000.00 | 407,076,021.16 | 454,051,091.16 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| 2018 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | සටහන | 2018<br>රු. | 2017<br>යළි ප්‍රකාශිත<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| බදු අයකිරීමට පෙර ශුද්ධ ලාභය/(අලාභය) | | (6,932,661.00) | 31,224,400 |
| **ගැලපුම්:** | | | |
| ක්ෂයවීම් | | 29,725,816.00 | 27,076,928 |
| විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය සඳහා වෙන්කිරීම් | | 1,120,128.00 | 3,089,158 |
| වත්කම් බැහැර කිරීම් මත ලාභය | | (1,318,500.00) | – |
| පොළී ආදායම් | | (9,572,626.00) | (12,118,517) |
| මහ භාණ්ඩාගාර ප්‍රදානය නිවැරැදි කිරීම | | | |
| **කාරක ප්‍රාග්ධන විචලනයට පෙර මෙහෙයුම් ලාභය/පාඩුව** | | 13,022,157.00 | 49,271,969 |
| භාණ්ඩ ලේඛන (වැඩිවීම්)/අඩුවීම් | | (21,220,502.00) | (40,994,714) |
| වෙළඳ සහ අනෙකුත් අයවිය යුතු (වැඩිවීම්)/අඩුවීම් | | 6,494,629.00 | (12,436,664) |
| වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු (වැඩිවීම්)/අඩුවීම් | | 11,549,522.00 | 20,125,888 |
| **මෙහෙයුම්වලින්/(භාවිතා කරනු ලැබූ) උත්පාදිත මුදල්** | | 9,845,806.00 | 15,966,480 |
| ගෙවන ලද පාරිතෝෂික | | (1,652,356.00) | (1,015,970) |
| ගෙවූ බදු | | (9,326,322.00) | (3,076,127) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ ලාභය/(භාවිතා කළ)** | | (1,132,873.00) | 11,874,383 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ** | | | |
| දේපළ, පිරියත හා උපකරණ අත්කර ගැනීම | | (50,336,202.00) | (11,326,338) |
| ජීව විද්‍යාත්මක වත්කම් අත්කර ගැනීම | | (51,579.00) | |
| දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීම | | 1,318,500.00 | |
| ලැබුණු පොළිය | | 9,572,626.00 | 9,382,604 |
| මූල්‍ය වත්කම්වල ශුද්ධ වෙනස්කම් | | (8,116,081.00) | (7,962,212) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්** | | (47,612,735.00) | (9,905,946) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්/(භාවිතා කළ)** | | | |
| ණය හා ණයගැනුම්වලින් අය | | 6,572,267.00 | 44,687,500 |
| අනෙකුත් මූල්‍ය වත්කම්වල (ආයෝජන)/ඉවත්කර ගැනීම් | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ/(භාවිතා කළ)** | | 6,572,267.00 | – |
| **මුදල් හා මුදලට සමාන දේවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | (42,173,341.00) | 1,968,436 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදලට සමාන දේ | | (12,660,406.00) | (59,316,342) |
| **වසර අවසානයේදී මුදල් සහ මුදලට සමාන දේ** | 16 | (54,833,747.00) | (12,660,406) |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1. වාර්තාකරණ අස්තිත්වය

### 1.1 සංස්ථාමය තොරතුරු

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 1992 සැප්තැම්බර් 30 දින සංස්ථා ගතකරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ 2009 ජූනි 16 වන දිනය ලියාපදිංචි කරන ලද ඇපයෙන් සීමිත වූ, ශ්‍රී ලංකාව නිත්‍ය වාසස්ථානය වන සමාගමකි.

සමාගමේ ලියාපදිංචි කාර්යාලය අංක 556, නාගහමුල්ල, පැලවත්ත, තලංගම දකුණ යන ලිපිනයෙහි පිහිටා තිබේ.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වනුයේ තේ වගාකිරීම සහ නිෂ්පාදනය සහ තේ වගාකරුවන්ගෙන් සහ තමන්ටම අයත් වතුයායයලින් මිලදී ගත් තේ අලෙවි කිරීමයි.

### 1.3 අධ්‍යක්ෂවරුන්

2018 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය මේ සමගින් ඉදිරිපත් කරයි. මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

2018 මාර්තු 31 දිනට සමාගමේ අධ්‍යක්ෂවරුන් පහත දැක්වෙන පරිදි වේ.
පී එස් සමරකෝන් මයා - සභාපති
අයි සුගතදාස මිය
එච් කස්තුරිආරච්චි මයා
පී රාසයියා මයා
ටී පී රත්නායක මයා
එම් ඒ එල් එච් එන් කේ මන්ත්‍රීනායක මයා
ඒ යූ සී අතුකෝරාළ මයා
ධම්මික අඹේවෙල මයා
ජී නල්ලපෙරුම මයා
කේ බ්‍රාහ්මන මයා

### 1.4 සමාගමේ ලේකම්වරු

කෝපරේට්සර්විසස් (පුද්ගලික) සමාගම
216, ද සේරම් පෙදෙස,
කොළඹ 05

### 1.5 ලියාපදිංචි කාර්යාලය

අංක 556, නාගහමුල්ල,
පැලවත්ත,
තලංගම දකුණ

### 1.6 විගණකවරු

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

### 1.7 මූල්‍ය ප්‍රකාශන නිකුත්කිරීමට බලය පැවරූ දිනය

මෙම මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය 2018 මැයි 31 දින බලය පවරන ලදී.

## 2. සාමාන්‍ය ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාසමාගමේ මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශ සඳහාවූ සටහන්වලින් සමන්විත වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවය.

### 2.2 මැණීමේ පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකමට අදාළව යෝග්‍ය හෙළිදරව් කිරීම් සිදුකර ඇති අවස්ථාවන්හි හැර මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ඓතිහාසික පිරිවැය පදනමිනි. වත්කම් හා බැරකම් ඒවායේ ස්වභාවය අනුව සහ සාපේක්ෂ ද්‍රවශීලතාව පිළිබිඹු කරන ආකාරයෙන් කණ්ඩායම් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි හඳුනාගෙන ඇති ප්‍රමාණ මත වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇතිකරන ගිණුම්කරණ ප්‍රතිපත්ති ආදේශ කිරීමේදී වැදගත් ඇස්තමේන්තු ක්ෂෙත්‍ර, අවිනිශ්චිතතාව සහ තීරණාත්මක තීන්දු පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන්වල ඇතුලත් කර තිබේ.

### 2.3 බදුකරණය

#### (අ) ප්‍රවර්තන බදු

මූල්‍ය ප්‍රකාශ වල වාර්තා කර ඇති පරිදි ආදායම් බදු සඳහා ප්‍රතිපාදන පදනම්ව ඇත්තේ ආදායම් සහ වියදම් මූලිකාංග මත වන අතර 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ සහ එහි තදනන්තර සංශෝධනයන්හි විධිවිධාන ප්‍රකාරව ගණනය කර ඇත.

### (ඉ) විලම්බිත බදු

බැරකම් ක්‍රමවේදය යොදා ගනිමින් විලම්බිත බදු සපයනු ලැබ ඇත්තේ, මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සහ බදු කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ප්‍රමාණයන් සඳහා වත්කම් සහ බැරකම් අතර ධාරණ ප්‍රමාණවල තාවකාලික වෙනස්කම්වලට විධිවිධාන සලස්වමිනි. විලම්බිත බදු මනිනු ලබන්නේ වාර්තාකරණ දිනය වන විට පනවා ඇති නීති මත පදනම්ව, තාවකාලික වෙනස්වීම් ප්‍රතිවර්තනය කළ විට ඒවාට ආදේශ කිරීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයටය.

විලම්භිත බදු වත්කම් පිළිගනු ලබනුයේ එම කාල අන්තරවලට සාපේක්ෂව ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි අනාගත බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාවක් ඇති ප්‍රමාණයටය. එක් එක් වාර්තාකරණ දිනයේදී විලම්බිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීමේ ඉඩක් තවදුරටත් නොමැතිවීමේ ප්‍රමාණයට අඩුකරනු ලැබේ.

## 2.4 වත්කම් තක්සේරුව සහ ඒවා මැනීමේ පදනම

### 2.4.1 දේපල, පිරියත සහ උපකරණ

දේපල, පිරියත හා උපකරණ සදහන් කරනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් සහ වටිනාකමේ කිසියම් හානියක් වේ නම් එය අඩු කර පිරිවැයට හෝ සාධාරණ අගයටය. සිදුවීම් හෝ තත්ත්වයන් වෙනස්වීම් මගින් ධාරණ වටිනාකම යළි අය කර ගත නොහැකි බව පෙන්නුම් කරන අවස්ථාවන්හිදී, දේපල, පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම හානිවීම් සඳහා සමාලෝචනය කරනු ලැබේ. සියලු දේපල, පිරියත හා උපකරණ මුලින්ම වාර්තා කර ඇත්තේ ඒවායේ පිරිවැය මත ය. දේපල, පිරියත හා උපකරණ තදාන්තරව ප්‍රතිප්‍රමාණ කර ඇති අවස්ථාවන්හිදී එබඳු වත්කම්වල සමස්ත කාණ්ඩයම සාධාරණ අගය මත ප්‍රතිප්‍රමාණ කරනු ලැබේ. මෙම ප්‍රතිප්‍රමාණ කිරීම ප්‍රමාණවත් නිත්‍යතාවකින් සිදු කරනු ලැබේ. යම් දේපලක් ප්‍රතිප්‍රමාණ කළ අවස්ථාවක එහි ධාරණ වටිනාකම වැඩිවීමත් සිදුවී ඇති අවස්ථාවක පෙර ආදායම් ප්‍රකාශවල සඳහන් වී ඇති එකී දේපල අවමවීමක් ලෙස සටහන් වූ අවස්ථාවකදී හැර එය ප්‍රතිවටිනාකම් සංචිතයට ඍජු ලෙස බැර කරනු ලබන අතර එවන් අවස්ථාවකදී වැඩිවීමම අදායම් ප්‍රකාශයේ පිළිගනු  ලැබේ. එකම වත්කමෙහි පෙර අතිරික්තයක් හිලව් කරන්නා වූ යම් ප්‍රත්‍යාගණන හිඟයක්, ප්‍රත්‍යාගණන සංචිතයේ අතිරික්තයට ඍජුවම හිලව් කරන අතර යම් අතිරික්තයක් වේ නම් එය වියදමක් ලෙස පිලිගනු ලැබේ.

බැහැර කිරීමේදී විකුණනු ලැබූ වත්කමට අදාළ කිසියම් ප්‍රත්‍යාගණන සංචිතයක් වේ නම් එය රඳවාගත් ඉපැයුම්වලට පවරනු ලැබේ. යම් දේපල, පිරියත හෝ උපකරණ අයිතම  ප්‍රතිස්ථාපනය කිරීමේදී හෝ බැහැර කිරීමේදී හෝ ඒවායේ භාවිතය මගින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන්නේ නම් ඒවා ඉවත් කරනු ලැබූ සේ සැලකේ. එසේ වත්කම් ඉවත් කිරීම හේතුවෙන් ඇතිවන කිසියම් ලාභයක් හෝ පාඩුවක් එලෙස ඉවත් කිරීම සිදු කළ වර්ෂයේ ආදායම් ප්‍රකාශයට ඇතුළු කරනු ලැබේ.

### (අ) ක්ෂයවීම

පිරිවැය මත සරල රේඛීය ක්‍රමය භාවිතා කිරීම මගින් හෝ සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියලු දේපල, පිරියත සහ උපකරණ තක්සේරු කිරීම මගින් එම වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය තුළ එම ප්‍රමාණ පොත් වලින් ඉවත් කිරීම පිණිස, ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදන ගණනය කරනු ලබයි. වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය පහත දැක්වෙන පරිදි වේ.

| වත්කම් කාණ්ඩය | අවුරුදු |
|---|---:|
| ගොඩනැගිලි | 20 |
| ආලේපකිරීම් | 5 |
| ජලය සහ විදුලිය | 20 |
| රථ වාහන | 4 |
| පිරියත හා යන්ත්‍රසූත්‍ර | 8 |
| උපකරණ | 8 |
| ලී බඩු සහ සවිකිරීම් | 8 |
| පරිගණක මෘදුකාංග | 8 |
| පරිගණක උපකරණ | 8 |
| මාර්ග | 10 |
| වෙනත් | 8 |

සින්නක්කර ඉඩම් සඳහා අසීමිත ආයු කාලයක් ඇතැයි සලකන බැවින් ඒවා ක්ෂය කරනු නොලැබේ.

සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම, උචිත නම් වත්කමේ අවශිෂ්ඨ වටිනාකම් ප්‍රයෝජ්‍ය ආයු කාල සහ ක්ෂයකිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කොට ගලපනු ලැබේ.

### (ආ) ප්‍රතිසංස්කරණ පිරිවැය

මුලින්ම තක්සේරු කළ කාර්යසාධන ප්‍රමිතියෙන් අපේක්ෂිත  අනාගත ආර්ථික ප්‍රතිලාභ ප්‍රකෘතිමත් කරීම හෝ පවත්වාගෙන යාම පිණිස දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියාව හෝ නඩත්තුව සඳහා දැරූ වැය, එලෙස දැරූ විටදී වියමදක් ලෙස පිළිගනු ලැබේ.

### 2.4.2 ජීවවිද්‍යාත්මක වත්කම්

සමාගම ජීව විද්‍යාත්මක වත්කම් පිළිගනු ලබන්නේ පිරිවැය පදනමෙනි. සමාගමේ ජීව විද්‍යාත්මක වත්කම් කැලබෝවිටියාන සහ දෑරංගල ඇති තේ පඳුරුවලින් සමන්විත වේ. සමාගම පැල අවුරුදු 3 දක්වා නොමේරූ ලෙස ද අවුරුදු 3ට වඩා පඳුරු මේරූ ලෙස ද පිළිගනියි.

### 2.4.3 මූල්‍ය වත්කම් (ව්‍යුත්පන්න නොවන)

සමාගම මුලින්ම ණය සහ ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවා උත්පාදනය කරනු ලැබූ දිනයට පිළිගනු ලබයි. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් (ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට නිශ්චය කරනු ලැබූ වත්කම් ඇතුළුව) සාධන පත්‍රයේ ගිවිසුම්කර ප්‍රතිපාදනයන්ට සමාගම පාර්ශවයක් වූ වෙළඳ දිනයට මුලින්ම පිළිගනු ලැබේ.

මුදල් ප්‍රවාහය වෙත වත්කමෙහි ගිවිසුම්කර හිමිකම් අවසන් වන විටදී හෝ මූල්‍ය වත්කමේ හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ පාරිතෝෂ සැලකිය යුතු ලෙස පවරනු ලබන ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්කර මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතින් එය පවරන විටදී සමාගම මූල්‍ය වත්කමක පිළිගැනීම ඉවත් කරයි. සමාගම විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳාවාගනු ලබන, පවරනු ලැබූ මූල්‍ය වත්කම්වල කවර හෝ බැඳිමක් වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස පිළිගනු ලබයි.

සමාගමට විට්නාකම් හිලව් කිරීමට නෛතික හිමිකමක් ඇතිවිටදී හෝ වත්කම ශුද්ධ පදනමක් මත පියවා හෝ උපලබ්ධි කර සමගාමීව බැරකම පියවීමට අදහස් කරන විටකදී පමණක්ම මූල්‍ය වත්කම් සහ බැරකම් හිලව් කරනු ලබන අතර ශුද්ධ පදනමකින් පියවීමට හෝ වත්කම උපලබ්ධි කොට බැරකම සමගාමීව පියවීමට අදහස් කරයි.

සමාගම සතුව පහත දැක්වෙන මූල්‍ය වත්කම් තිබේ. (ව්‍යුත්පන්න නොවන)

- ණය හා ලැබිය යුතු දේ
- මුදල් හා මුදලට සමාන දේ

### (අ) ණය හා ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු සක්‍රීය වෙළඳපොළක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. එබඳු වත්කම් මුලින්ම සාධාරණ අගය සහ සෘජුව ආරෝපණය කළ හැකි කිසියම් ගනුදෙනු පිරිවැයකට පිළිගනු ලැබේ. මූලික පිළිගැනිමට තදනන්තරව, ණය හා ලැබිය යුතු දෑ ගණනය කරනු ලබන්නේ යම් හානිකරණ අලාභ අඩුකොට සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂිත පිරිවැයටය. ණය සහ ලැබිය යුතු දෑ වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑවලින් සමන්විත වේ.

### (ඇ) මුදල් හා මුදලට සමාන දෑ

මුදල් ප්‍රවාහ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයන්හි, මුදල් හා මුදලට සමාන දෑ මුදල් ශේෂ හා  මාස තුනක් හෝ ඊට අඩු මූලික කල්පිරීමක් සහිත ඒක්ෂණ තැන්පතුවලින් සමන්විත වේ. ඉල්ලුම මත ආපසු ගෙවිය හැකි සහ සමාගමේ මුදල් කළමනාකරණයේ අනුකලන කොටසක් වන්නාවූ බැංකු අයිරා මුදල් හා මුදලට සමාන දේවල සංරචකයක් ලෙස මුදල් ප්‍රවාහයන්හි කාර්යය සඳහා අන්තර්ගත කොට ඇත. මුදල් හා මුදලට සමාන දෑ අතැති මුදල් හා බැංකුවේ තැන්පතුවලින් සමන්විත වේ. වක්‍ර ක්‍රමවේදය භාවිතා කරමින් සකස් කොට ඇති මුදල් ප්‍රවාහයන්හි කාර්යය සඳහා මුදල් හා මුදලට සමාන දෑ සංරචකයක් ලෙස බැංකු අයිරා අන්තර්ගත කොට ඇත.

## 2.4.4 හානි

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයක් දරනු නොලබන මූල්‍ය වත්කමක්, එය හානිවූ බවට වාස්තවික සාක්ෂි තිබේදැයි නිර්ණය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයට තක්සේරු කරනු ඇත.

වත්කමේ මූලික පිළිගැනීමෙන් පසු අලාභ සිදුවීමක් සිදුව ඇති බවට වාස්තවික සාක්ෂි මගින් පෙන්නුම් කරන්නේ නම් සහ විශ්වාසනීය ලෙස මැණිය හැකි එම වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්ට නිශේධනීය බලපෑමක් එම අලාභ සිදුවීම ඇති කළේ නම් මූල්‍ය වත්කමක් හානිවී ඇත.

ලැබිය හැකි දේ සඳහා හානි පිළිබඳ සාක්ෂි සමාගම සාමූහික මට්ටමේදී සලකා බලයි. සමාන අවදානම් ගතිලක්ෂණ සහිත ලැබිය හැකි සියලු දේ එකට කාණ්ඩ කරන අතර සිදුව ඇති එහෙත් මෙතෙක් හඳුනාගෙන නොමැති කිසියම් හානියක් සඳහා සාමූහිකව තක්සේරු කරනු ඇත.

ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කමකට අදාළ හානි අලාභයක් එහි ධාරණ වටිනාකම හා වත්කමේ මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරනු ලැබූ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි වත්මන් වටිනාකම අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ. අලාභවීම් ලාබ හෝ පාඩුවල පිළිගනු ලබන අතර ලැබීම්වලට සාපේක්ෂව දීමනා ගිණුමක පෙන්නුම් කරනු ලැබේ. හානිවූ වත්කමක් මත පොළිය, වට්ටම අනාගතයට ගැලපිම හරහා අඛණ්ඩව පිළිගනු ලැබේ. පසුව ඇතිවන සිදුවීමක් හානි අලාභ වටිනාකම අඩුකිරීමට හේතුවන්නේ නම්, ලාබ හෝ පාඩු හරහා හානි අලාභයේ අඩුවීම ප්‍රතිවර්තනය කරනු ලැබේ.

## 2.4.5 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ පිරිසකසන ලද, පිරිනොසකසන ලද හා අර්ධ පිරිසකසන ලද කෘෂිකාර්මික නිෂ්පාදන සහ අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍යයන්ගෙන් සමන්විත වේ. පිරිසකසන ලද, පිරිනොසකසන ලද හා අර්ධ පිරිසකසන ලද කෘෂිකාර්මික නිෂ්පාදන මූල්‍ය කාල සීමාව අවසානයේදී පූර්ණව පිරිසකසන ලද කෘෂිකාර්මික නිෂ්පාදන සේ සළකනු ලබන අතර ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයට තක්සේරු කරනු ලැබේ.

අනෙකුත් පාරිභෝජ්‍ය ද්‍රව්‍ය තක්සේරු කර ඇත්තේ වඩා අඩු පිරිවැයට සහ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. වට්ටෝරු භාණ්ඩ විකිණීමේදී, එම වට්ටෝරු භාණ්ඩයන්හි ධාරණ මුදල අදාළ ආදායම පිළිගනු ලැබූ කාලසීමාවේ වියදමක් ලෙස සමාගම පිළිගනු ලබයි.

## 2.5 බැරකම් සහ ප්‍රතිපාදන

අතීත සිදුවීමකින් මතුවන වත්මන් බැඳීමක් පියවීමේදී ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලායාමක් එහි ප්‍රතිඵලය වේයැයි අපේක්ෂා කරනු ලබන විටදී මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ බැරකම් පිළිගනු ලැබේ. ණයකරු ඉල්ලා සිටි විටදි හෝ වාර්තාකරණ දිනයේ සිට වසරක් තුළ ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම බැරකම් ලෙස සලකනු ලැබේ. මූල්‍ය තත්ත්වය දිනයේ සිට එක් වසරකට පසුව ගෙවිය යුතු බැරකම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් සේ සලකනු ලැබේ.

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස නෛතික හෝ සම්මුතික බැඳීමක් සමාගම සතු විටදී සහ එම බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගලා ඒමේ හැකියාවක් ඇති හා ඒ සදහා විශ්වාසය තැබිය හැකි ඇස්තමේන්තුවක් සෑදිය හැකිවීම  අවශ්‍ය කරනු ලබන විටකදී  මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

### 2.5.1 විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්

#### (අ) සැලසුම්ගත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති සූත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19ට අනුකූලව පළමු සේවා වසරින් ආරම්භ වී සම්පූර්ණ කර ඇති සේවය කරන ලද සෑම වසරක් සඳහා ම සියලු සේවකයන්ට, මූල්‍ය වසරේ අවසන් මාසයේ අර්ධ මාසික වැටුප පාදකව ශේෂ පත්‍රයේ වෙන් කිරීමක් ඉදිරියට රැගෙන යනු ලැබේ. මෙම ප්‍රතිපාදනය ආයුගණකව තක්සේරු කරන්නක් නොවේ.

#### (ආ) සැලසුම්ගත දායකත්ව සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල

අදාල ප්‍රඥප්ති සහ නියමයන් ප්‍රකාරව සේවකයින් සේවක අර්ථසාධක අරමුදල් දායක මුදල් සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ දායක මුදල් වලට  සුදුසුකම් ලබයි.

## 2.6 විස්තීර්ණ  ආදායම් ප්‍රකාශය

### 2.6.1 ආදායම පිළිගැනීම

ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති සහ දරන ලද හෝ දැරීමට නියමිත ආදායම සහ ආශ්‍රිත පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණයට ආදායම පිළිගනු ලැබේ. ලැබුණු ප්‍රතිෂ්ඨාව හෝ විකිණුම් වට්ටම් හෝ විකුණුම් බදු නොමැතිව ලැබිය යුතු දේවල සාධාරණ වටිනාකමට ආදායම ගණනය කරනු ලැබේ.

#### (අ) භාණ්ඩ විකිණුම

හිමිකාරිත්වය හා සාමාන්‍යයෙන් සබැඳුණු ප්‍රමාණයට අඛණ්ඩ කළමනාකාරිත්ව මැදිහත්වීමක් හෝ විකුණන ලද භාණ්ඩ පිළිබඳ සඵල පාලනයක් සමාගම විසින් රඳවා නොගන්නා විට හා භාණ්ඩවල හිමිකාරිත්වයේ සැලකිය යුතු අවදානම් සහ පරිදාන ගැනුම්කරුට පවරා ඇති විටදී භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම පිළිගනු ලැබේ.

#### (ආ) ලාභ හා අලාභ

දේපල, පිරියත උපකරණ හා ආයෝජන ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් අපහරණය කිරීමේදී පැන නගින ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාබ අලාභ ඒ සඳහා අපරහණය මත ලැබෙන මුදල් වලින්, එවන් වත්කම්හි ධාරණ මුදල හා ආශ්‍රිත විකුණුම් වියදම්වලින් අඩු කිරීමෙන් පසු ආදායම් ප්‍රකාශයේ ගණන් දක්වා ඇත. ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්වලට ආනුෂංගික ක්‍රියාකාරම්වලින් පැන නගින හා ද්‍රව්‍යමය නොවන සමාන ගනුදෙනු කාණඩයකින් පැන නගින ලාභ හා අලාභ ශුද්ධ පදනමකින් එකතු කොට, වාර්තා කොට ඉදිරිපත් කරනු ලැබේ.

සහතික කරන ලද කුලි මුදල්වලින් මතුවන කිසියම් අලාභයක් එම අලාභය සිදුවූ වසරේදීම ගිණුම්වල දක්වනු ලැබේ. හොඳම ඇස්තමේන්තුව අලාභයක් පෙන්නුම් කරන්නේ නම්, ප්‍රතිපාදනයක් පිළිගනු ලැබේ.

#### (ඇ) පොළී ආදායම

සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් උපචිත පදනමකින් පොළී ආදායම පිළිගනු ලැබේ.

#### (ඈ) අනෙකුත් ආදායම

අනිකුත් ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ.

### 2.6.2 වියදම් පිළිගැනීම

ආදායම් ප්‍රකාශනයේ වියදම් පිළිගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම වල ඉපැයීම් අතර සෘජු සම්බන්ධය පදනම් කර ගෙනය. ඵලදායී අන්දමින් ව්‍යාපාරය පවත්වා ගෙන යාමට සහ දේපල, පිරියත හා උපකරණ නඩත්තු කිරීමට දරන ලද සියලු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කර තිබේ. විස්තීරණ ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, සමාග මේ කාර්ය සාධනයේ මූලිකාංග සාධාරණව ඉදිරිපත් කරන්නේය යන පදනමින් "වියදමේ ශ්‍රිතය" ක්‍රමවේදය යොදා ගෙන ඇත.

## 2.7 කොටසක් සඳහා මූලික ඉපැයුම්/(පාඩු)

තම සාමාන්‍ය කොටස් සඳහා සමාගම කොටසක් සඳහා මූලික ඉපැයුම්/(පාඩු) දත්ත ඉදිරිපත් කරයි. කොටසක් සඳහා දත්ත ගණනය කරනු ලබන්නේ සමාගමේ සමාන්‍ය කොටස්හිමියන්ට ආරෝපණීය ලාබය හෝ පාඩුව අදාළ කාලසීමාවේ නොපියවූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාවේ භරිත සාමාන්‍යයෙන් බෙදීම මගිනි.

## 2.8 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන කාල සීමාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය ඉහළ නැංවීම හා අන්තර් කාලසීමා සංසන්දනීයභාවය වැඩි දියුණු කිරීම පිණිස මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කර ඇති සියලු වටිනාකම් සඳහා පෙර කාල සීමාවට අදාළ ප්‍රමාණාත්මක, සංඛ්‍යාන හා විස්තරාත්මක තොරතුරු ඇතුළුව සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශනයන්හි අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කර ඇති විටදී, වඩා හොඳ ඉදිරිපත් කිරීමක් සැපයීම පිණිස ප්‍රවර්තන වසර සමග අනුකූලවීම පිණිස සංසන්දනාත්මක වටිනාකම් ද නැවත වර්ගීකරණය කර ඇත.

## 2.9 වාර්තාකරණ දිනයට පසුව සිදුවන සිදුවීම්

මූල්‍ය තත්වය පිළිබඳ සියලු ද්‍රව්‍යමය පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම් සලකා බලා, යෝග්‍ය අවස්ථාවන්හිදී අනාවරණය කර, මූල්‍ය ප්‍රකාශනයන්හි අදාළ සටහන්වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

## වාර්තා කරන දිනය වන විට නිකුත් කර තිබූ එහෙත් බලාත්මක නොවූ නව ගිණුම්කරණ ප්‍රමිති

නිකුත් කරන ලද එහෙත් සමාගමේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කරන දිනය දක්වා බලාත්මක නොවූ ප්‍රමිති පහත ලැයිස්තු ගත කර ඇත. මෙම ප්‍රමිති ලැයිස්තුගත කිරීම හා නිකුත් කරන ලද අර්ථ නිරූපණ, අනාගත දිනයකදී ආදේශ කළ විටදී හෙළිදරව් කිරීම්, මූල්‍ය තත්වය හෝ කාර්ය සාධනය මත බලපෑමක් ඇති කරනු ඇතැයි සමාගම සාධාරණව අපේක්ෂා කරන ඒවා වේ. ඒවා බලාත්මක වූ විටදී යොදා ගැනීමට සමාගම අදහස් කරයි.

## ශ්‍රීල මූ වා ප්‍ර 9 - මූල්‍ය සාධන පත්‍ර

මූල්‍ය වත්කම් පිළිගැනීම, මැනීම හා වර්ගීකරණය සහ මූල්‍ය බැරකම් වර්ගීකරණය හා මැනීමට අදාළ අවශ්‍යතා, මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් පිළිගැනීමෙන් ඉවත්කිරීම හා සාධාරණ වටිනාකමට මනින්නේ කෙසේද යන්න පිළිබඳව වූ ගිණුම්කරණ ප්‍රමිති 39 හි විධිවිධාන ප්‍රතිස්ථාපනය කරන මූල්‍ය සාධන පත්‍ර ශ්‍රී ල මූ වා ප්‍ර 9 ට එකතු කර ඇත.

ශ්‍රී ල මූ වා ප්‍ර 9 බලාත්මක වන දිනය 2018 ජනවාරි 01 දක්වා කල් දමා ඇත.

පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රමිති සමාගමේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපෑමක් ඇති කරනු ඇතැයි අපේක්ෂා නොකරයි.

1. ශ්‍රී ල මූ වා ප්‍ර 14 - නියාමන විලම්බන ගිණුම්: බලාත්මක දිනය 2016 ජනවාරි 01
2. ශ්‍රී ල මූ වා ප්‍ර 15 - පාරිභෝගිකයන් සමග කොන්ත්‍රාත්වලින් ආදායම: බලාත්මක දිනය 2017 ජනවාරි 01
3. ශ්‍රී ල ගි ප්‍ර 16 හා ශ්‍රී ල ගි ප්‍ර 41 සංශෝධන - භාරක පිරියත: බලාත්මක දිනය 2016 ජනවාරි 01

## 3. ආදායම

| 2018 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | සටහන | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | 31.1 | | |
| දළ විකුණුම් | | 941,276,205.00 | 899,641,330 |
| අඩු කළා: තැරැව්කාර ගාස්තු සහ විකුණුම් වියදම් | | (13,118,730.94) | (12,830,845) |
| | | 928,157,474.06 | 886,810,485 |
| එකතු කළා: දේශීය විකුණුම් | | 76,162,149.04 | 48,781,400 |
| **එකතුව** | | 1,004,319,623.10 | 935,591,884 |

## 4. විකුණුම් පිරිවැය

| 2018 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා<br>කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම | සටහන | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **විකුණුම් පිරිවැය** | 31.2 | | |
| අමු දළු මිලයට ගැනුම් | | 721,609,743.41 | 660,791,665 |
| නිෂ්පාදන පිරිවැය | | 168,477,961.77 | 181,213,223 |
| නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | | 118,518,428.42 | 78,819,360 |
| **නිෂ්පාදන පිරිවැය** | | 1,008,606,133.60 | 920,824,248 |
| **නිමි භාණ්ඩ සංචලන** | | | |
